The Socialist

ශ්‍රී ලංකාවේ හා දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වයේ මාසික ප්‍රකාශනය

භූ-දේශපාලනය | න්‍යාය | ඉතිහාසය | කලාව | පන්ති අරගල

## නේපාල-චීන ගංවතුර, දේශගුණික විපර්යාසය සහ සමාජවාදය සඳහා වන අරගලය

කිසිදු ධනපති ආණ්ඩුවක් දේශගුණික විපර්යාස සඳහා කිසිදු බරපතල විසඳුමක් යෝජනා නොකරන්නේ, ආර්ථික ජීවිතය මූල්‍ය කතිපයාධිකාරියේ ද්‍රව්‍යමය වුවමනාවන්ට යටත් කර ඇති තාක් කල් එය කළ නොහැකි බැවිනි. පි.7

## බර්නි සැන්ඩර්ස්ගේ AI ලිපිය: කතිපයාධිකාරයට කළ බංකොලොත් ආයාචනයක්

“මිනිසුන්ට පාලනය කළ නොහැකි යන්ත්‍ර තැනීම නවත්වන්න” යන්න ප්‍රශ්නය හරියටම වැරදි ආකාරයෙන් මතු කිරීමකි. ප්‍රශ්නය වන්නේ මිනිසුන් AI පාලනය කරන්නේද යන්න නෙවෙයි, කිනම් පන්තිය විසින්ද යන්නයි. පි.10

## ඇමරිකානු කම්කරුවෝ සහ තරුණයෝ සමාජවාදය දෙසට හැරෙමින් සිටිති

සමාජවාදය සඳහා වන සහයෝගය ධාවනය වනු ලබන්නේ, ධනවාදය තමන්ට පිරිනමන්නේ යුද්ධය, දරිද්‍රතාවය සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට එල්ල වන ප්‍රහාරයන්ගෙන් සමන්විත අඳුරු අනාගතයක් පමණක් බව පැහැදිලිවම වටහා ගැනීමට පටන් ගෙන සිටින කම්කරු පන්තියේ නව පරම්පරාවේ අත්දැකීම් විසිනි. පි.13

## CIMP පනත් කෙටුම්පත පිළිබඳ FMM සංවාදයට අප මැදිහත් වන්නේ ඇයි? මාධ්‍ය නිදහස සඳහා වූ ස්වාධීන පන්ති වැඩපිළිවෙළක් 8.16



## බොග්ඩාන් සයිරොටියුක් වහාම සහ කොන්දේසි විරහිතව නිදහස් කරන ලෙස බලකර සිටිමු: ෆැසිස්ට් තීන්දුව අහෝසි කරනු!

බොග්ඩාන් සයිරොටියුක් කළ එකම වරද සත්‍යය පැවසීමයි: එනම් මෙය අධිරාජ්‍යවාදී යුද්ධයක් බව, යුක්‍රේනියානු සහ රුසියානු කම්කරුවන් තමන්ගේ පාලක පන්ති තුළ පොදු පන්ති සතුරෙකුට මුහුණ දෙන බව සහ නාසි සහායකයින් ජාතික වීරයන් ලෙස සැමරීම ඓතිහාසික මතකයට එරෙහි අපරාධයක් බව පැවසීමයි. මේ සඳහා ඔහු වසර පහළොවක සිරදඬුවමකට මුහුණ දී සිටී.. පි.2



**ගායකයාට කිසිවක් හිමි නැත: ශ්‍රී ලංකාවේ ප්‍රකාශන හිමිකම් පනත සහ කලාව තුළ ධනපති දේපළ අයිතියේ තර්කනය** පි.5

# බොග්ඩාන් සයිරොටියුක් වහාම සහ කොන්දේසි විරහිතව නිදහස් කරන ලෙස බලකර සිටිමු: ෆැසිස්ට් තීන්දුව අහෝසි කරනු!

ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වයේ (Socialist Lead of Sri Lanka and South Asia – SLLA) ප්‍රකාශනය.

මෙම ප්‍රකාශය theSocialist.lk වෙබ් අඩවියේ 2026 අගෝස්තු 24 දින ඉංග්‍රීසි බසින් පළ කෙරුණි.

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (International Committee of the Fourth International – ICFI) ජාත්‍යන්තර සමාජවාදී ඉදිරිදර්ශනය සමග සහයෝගීතාවයෙන්, දකුණු ආසියාවේ විප්ලවවාදී නායකත්වය ගොඩනැගීම සඳහා කම්කරු පන්තිය සහ තරුණයින් අතර සටන් වදින ශ්‍රී ලංකාවේ සහ



බොග්ඩාන් සයිරොටියුක්, *2023* අප්‍රේල්

දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය (Socialist Lead of Sri Lanka and South Asia – SLLA), රුසියාවට එරෙහි එජා-නැටෝ (US-NATO) යුද්ධයට එරෙහිවූවෙකු, බොල්ෂෙවික්-ලෙනින්වාදීන්ගේ තරුන රැකවල හි (Young Guard of Bolshevik-Leninists) නායකත්ව සාමාජිකයෙකු සහ 27 හැවිරිදි යුක්‍රේනියානු සමාජවාදියෙකු වන බොග්ඩාන් සයිරොටියුක්ට (Bogdan Syrotiuk) "යුද නීතිය යටතේ රාජ්‍ය ද්‍රෝහී වීම" යන චෝදනාව මත වසර 15 ක සිරදඬුවමක් නියම කරමින් 2026 අගෝස්තු 10 වන දින නිකොලෙව් කලාපයේ දිස්ත්‍රික් උසාවියක් විසින් දෙන ලද ෆැසිස්ට් තීන්දුව දැඩි ලෙස හෙළා දකී. මෙම තීන්දුව වහාම අහෝසි කරන ලෙසත් බොග්ඩාන් කොන්දේසි විරහිතව නිදහස් කරන ලෙසත් අපි බලකර සිටිමු.

පර්වොමයිස්ක් නගර දිස්ත්‍රික් උසාවිය (inbox@pm.mk.court.gov.ua) සහ මයිකොලයිව් අභියාචනා උසාවිය (inbox@mka.court.gov.ua) වෙත යවන ලද අතර, එහි පිටපතක් ලෝක සමාජවාදී වෙබ් අඩවිය (World Socialist Web Site – freebogdan@wsws.org) වෙත යවන ලදී.

රුසියානු රාජ්‍යයේ නියෝජිතයෙකු බවට වූ පදනම් විරහිත චෝදනාව මත 2024 අප්‍රේල් 25 වන දින යුක්‍රේන ආරක්ෂක සේවය (Security Service of Ukraine) විසින් බොග්ඩාන් අත්අඩංගුවට ගන්නා ලදී. වසර දෙකකට වැඩි කාලයක් ගතවී ඇතත්, එම චෝදනාව සඳහා කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොමැත. ඇත්ත වශයෙන්ම උසාවිය හමුවේ තබන ලද්දේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ

(World Socialist Web Site) පළවූ ලිපි හයක් සහ 2023 මැයි දින කථාවක් වන “රුසියාවේ සහ යුක්‍රේනයේ කම්කරු පන්තියේ එක්සත්කම සඳහා!” යන්නයි. මෙම ලේඛන මගින් පුටින් පාලනය විසින් ආරම්භ කරන ලද සහ එජා-නැටෝ (US-NATO) ප්‍රොක්සි ගැටුමක් ලෙස ගෙනයනු ලබන යුද්ධයට එරෙහිව යුක්‍රේනියානු සහ රුසියානු කම්කරුවන්ගේ ජාත්‍යන්තර එක්සත්කම කැඳවුම් කරන ලදී; නාසි සහකාරක ස්ටෙපාන් බන්ඩෙරා (Stepan Bandera), යුක්‍රේන ජාතිකවාදීන්ගේ සංවිධානය (Organization of Ukrainian Nationalists – OUN) සහ වෆෙන්-එස්එස් ගැලීසියා බළකාය (Waffen-SS Galicia Division) සෙලෙන්ස්කි ආණ්ඩුව විසින් පුනරුත්ථාපනය කිරීම ඒවායින් හෙළිදරව් කරන ලදී; තවද යුක්‍රේනය තුළ මැතිවරණ සහ විපක්ෂ දේශපාලනය අහෝසි කිරීම ලේඛනගත කරන ලදී. මෙයින් කිසිවක් අබමල් රේණුවක හෝ අර්ථයක් දරා සිටින කිසිදු නෛතික ප්‍රමිතියක් යටතේ රාජ්‍ය ද්‍රෝහීකමක් නොවේ. එය යුක්‍රේනය ද අත්සන් කර ඇති මානව හිමිකම් පිළිබඳ යුරෝපීය සම්මුතියේ (European Convention on Human Rights) 10 වැනි වගන්තිය මගින් ප්‍රතිපත්තියක් ලෙස ආරක්ෂා කර ඇති දේශපාලන ප්‍රකාශනයකි.

රාජ්‍යයේම අධිකරණ වෛද්‍ය ආයතනවලට පවා මෙම නඩුව පවත්වාගෙන යාමට නොහැකි විය. ප්‍රබල යුක්‍රේනියානු අපරාධ විද්‍යාඥයෙකු වන යූරි ඉර්කින්ගේ (Yuri Irkhin) පිටු 65 ක වාර්තාවකින් බොග්ඩාන්ගේ ලේඛනවල රුසියානු ආක්‍රමණය සඳහා වූ ප්‍රචාරණයකට සමාන වන කිසිවක් සොයා ගැනීමට නොහැකි විය. වෙනස් ප්‍රතිඵලයක් බලාපොරොත්තුවෙන් උසාවිය විසින් රාජ්‍යය මෙහෙයවන ලද දෙවන පරීක්ෂණයක් නියෝග කළ විට, එම ආයතනයට පවා, ආණ්ඩුව පෙරළා දැමීමේ කැඳවුමක්, බලය අල්ලා ගැනීමේ උපදේශනයක් හෝ යුක්‍රේනයේ දේශසීමා වෙනස් කිරීමට සහය දැක්වීමක් හඳුනා ගැනීමට නොහැකි විය. උසාවිය තමන්ගේම විශේෂඥයන් නොසලකා හැරියේය. එය විත්තිය නොසලකා හැරියේය. එය නීතිය නොසලකා හැරියේය. අගෝස්තු 10 වන දින නිකුත් කරන ලද්දේ අධිකරණ තීන්දුවක් නොව සෙලෙන්ස්කි පාලනයේ දේශපාලන නියෝගයකි – බොග්ඩාන්ගේ ස්ථාවරයන්ගේ “සාමාජික වශයෙන් අන්තරායකාරී ප්‍රතිවිපාක” උපුටා දක්වන නඩු තීන්දුවෙන්ම අර්ධ වශයෙන් පිළිගන්නා පරිදි – එය කිසිදු ඔත්තු බැලීමේ ක්‍රියාවක් ඉලක්ක කරගත් එකක් නොව, යුක්‍රේනියානු කම්කරුවන් සහ සෙබළුන් අතර යුද විරෝධී හැඟීම් වර්ධනය වීම ඉලක්ක කරගත් එකකි. 2025 දී සිදු කරන ලද මත විමසුමකට අනුව යුක්‍රේනියානුවන්ගෙන් සියයට 69 ක් යුද්ධය සාකච්ඡා මාර්ගයෙන් අවසන් කිරීමට පක්ෂපාතී වූ අතර – එය 2022 ට සාපේක්ෂව සම්පූර්ණ ආපසු හැරීමකි – ආක්‍රමණය ආරම්භ වූ තැන් සිට හමුදාව හැරයාම සම්බන්ධයෙන් යුක්‍රේනියානු සෙබළුන්ට එරෙහිව අපරාධ නඩු 300,000 කට වඩා විවෘත කර ඇත. සෙලෙන්ස්කි ඒකාධිපතිත්වය බොග්ඩාන් සයිරොටියුක් සිරගත කිරීම තුළින් මර්දනය කිරීමට උත්සාහ කරන්නේ පහළින් මතුවන මෙම වැඩෙන කැරලි ගැසීම මිස මොස්කව් වෙතින් එල්ල වන කිසිදු තර්ජනයක් නොවේ.

මෙම තීන්දුව ලබා දී ඇති පාලන තන්ත්‍රයේ ස්වභාවය පැහැදිලිව ප්‍රකාශ කළ යුතුය. වොලොඩිමියර් සෙලෙන්ස්කිගේ ජනාධිපති ධුර කාලය 2024 මැයි මාසයෙන් අවසන් විය. වසර දෙකකට පසුවත්, ඔහු අද පාලනය කරන්නේ අධිකාරී නියෝග මගින්, යුධ නීතිය යටතේ, මැතිවරණ දින නියමයක් නොමැතිව අත්හිටුවමිනි. 2015 සිට කොමියුනිස්ට් පක්ෂ සහ සංකේත තහනම් කර ඇත. 2022 දී ආණ්ඩුව විසින් විපක්ෂ දේශපාලන පක්ෂ එකකොළහක වැඩකටයුතු අත්හිටුවන ලද අතර, පසුව පාර්ලිමේන්තුවේ විශාලතම විපක්ෂ කන්ඩායම මුළුමනින්ම තහනම් කරන ලදී. 2024 ජූනි මාසයේ සිට ලෝක සමාජවාදී වෙබ් අඩවිය (World Socialist Web Site) යුක්‍රේනය තුළ අවුරා ඇත. යුක්‍රේනයේ රාජ්‍ය ද්‍රෝහී සහ සහයෝගිතා (collaboration) පනත් යටතේ අපරාධ නඩු 20,000 ක් පමණ විවෘත කර ඇති අතර, එම නීති අන්තරායකාරී ලෙස පුළුල් හා අපැහැදිලි බව හියුමන් රයිට්ස් වොච් (Human Rights Watch) සංවිධානය විස්තර කර ඇත. අත්පත් කරගත් ප්‍රදේශවල හදිසි සේවා, ඉදිකිරීම් සහ කසල ඉවත් කිරීමේ කටයුතු කළ පුද්ගලයන් පවා රාජ්‍ය ද්‍රෝහීන් ලෙස නඩු පවරා ඇත. යුක්‍රේන අත්අඩංගුවේ පසුවන්නන්ට වධහිංසා පැමිණවීම සහ පීඩා කිරීම සම්බන්ධයෙන් දිගටම ලේඛනගත කරන බව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාලය 2025 සැප්තැම්බර් වාර්තා කළේය. යුරෝපීය මණ්ඩලයේ වධහිංසා විරෝධී කමිටුව විසින් යුක්‍රේන පූර්ව නඩු-විභාග පහසුකම්වල (remand prisons) තත්ත්වය අමානුෂික හා පහත් තත්ත්වයක පැවතිය හැකි බව විස්තර කර ඇත. අත්අඩංගුවට ගන්නා අවස්ථාව වන විටත් සෞඛ්‍ය තත්ත්වය දුර්වලව පැවති, වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ හදිසි වෛද්‍ය ප්‍රතිකාර අහිමි කර ඇති විත්තිකරුවෙකුට මෙම පද්ධතිය තුළ වසර පහළොසක සිරදඬුවමක් නියම කිරීම යනු ක්‍රමයෙන් මරණයට පත්කිරීමේ දඬුවමකට නොඅඩු දෙයකි.

ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ වෙසෙන අපට මෙම පාලන ක්‍රමය හඳුනා ගැනීමට කිසිදු අපහසුවක් නැත, මන්ද අපද මෙහි විවිධ රූපයන් හරහා ජීවත් වී ඇති බැවිනි. ශ්‍රී ලංකා රාජ්‍යය “ජාතික ආරක්ෂාව” නාමයෙන් දශක ගණනාවක් තිස්සේ වාර්ගික සිවිල් යුද්ධයක් ගෙන ගිය අතර, විපක්ෂ වීම අපරාධයක් කිරීමට, නඩු විභාගයකින් තොරව සැකකරුවන් රඳවා තබා ගැනීමට සහ යුද්ධයේ අවසාන අදියරේදී දෙමළ ජනතාවට එරෙහිව මහා පරිමාණ අපරාධ සිදු කිරීමට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (Prevention of Terrorism Act) වැනි නීති භාවිතා කළ අතර රාජ්‍යය සහ එහි ක්ෂමාලාපකයන් අදටත් එම අපරාධ සිදුකළ බව ප්‍රතික්ෂේප කරති. මෙම ඉතිහාසයෙන් බිඳී යාමක් පොරොන්දු වෙමින් බලයට පත් වූ දිසානායක නායකත්වය දෙන ජේවීපී-එන්පීපී (JVP-NPP) ආණ්ඩුව, ඒ වෙනුවට තමන්ගේ පූර්වගාමීන්ගෙන්

උරුම වූ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) නියෝග කළ කප්පාදු වැඩසටහන තවදුරටත් ගැඹුරු කර ඇති අතර, රාජ්‍යයේ මර්දනකාරී යන්ත්‍රණය බොහෝ දුරට එලෙසම පවත්වා ගෙන යමින් කම්කරුවන්ගේ, වතු කම්කරුවන්ගේ, ශිෂ්‍යයන්ගේ සහ දෙමළ හා මුස්ලිම් සුළුතරයන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී හා සාමාජික අයිතිවාසිකම් තවදුරටත් මර්දනය කරමින් සිටී. ඉන්දියාවේ හින්දුත්ව (Hindutva) වාර්ගික-ජාතිකවාදී ව්‍යාපෘතියේ සිට කලාපයේ වෙනත් ස්ථානවල මිලිටරි හා සිවිල් ඒකාධිපතිවාදය දක්වා මුළු දකුණු ආසියාව පුරාම, පාලක පන්ති ගැඹුරු වන ආර්ථික අර්බුදයට සහ මහජන සමාජ විරෝධයට ප්‍රතිචාර දක්වන්නේ සහන ලබා දීමෙන් නොව, වාමාංශික සහ යුද විරෝධී දේශපාලනය අපරාධයක් බවට පත් කිරීමෙනි. බොග්ඩාන් සයිරොටියුක්ට හිංසා පීඩා කිරීම යනු එහි අවසාන, අධිරාජ්‍යවාදී අදියරේ පවතින ධනපති ක්‍රමයේ ලෝක ප්‍රවණතාවයක තියුණු ප්‍රකාශනයකි: යුද්ධය සහ අගහිඟකම්, පහළින් මැඩපැවැත්විය නොහැකි විරෝධයක් ජනනය කරන විට, සෑම තැනකම පාලක පන්ති ඒකාධිපතිත්වයට අත පොවයි.

ලෝක සමාජවාදී වෙබ් අඩවියේ වචන වලින් පැවසුවහොත්, වඩාත්ම මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් කෙරෙහි තමන්ගේ ෆැසිස්ට් අවඥාව මේ වන විටත් පෙන්නුම් කර ඇති අධිකරණ පද්ධතියක අභිමතයට අත්හැර දැමීමට හෝ බොග්ඩාන් සයිරොටියුක්ගේ නඩුව යුක්‍රේනයේ අභ්‍යන්තර කරුණක් ලෙස සැලකිය නොහැක්කේ එබැවිනි. **එය ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ කම්කරු පන්තිය සහ තරුණයින් ඇතුළු සමස්ත ජාත්‍යන්තර කම්කරු පන්තියටම පරීක්ෂණයකි.** මෙම යුද්ධය පුරාම සෙලෙන්ස්කි පාලනය සන්නද්ධ කළ සහ මූල්‍යමය වශයෙන් පෝෂණය කළ අධිරාජ්‍යවාදී බලවතුන් – නේටෝ (NATO) බලවතුන් සහ ඔවුන්ගේ මිත්‍ර පාක්ෂිකයින් සමඟ ප්‍රධාන වශයෙන් එක්සත් ජනපදය – රුසියාව සමඟ සෘජු ගැටුමක් දෙසට සහ අවසානයේ ඉරානය, වෙනෙසුවේලාව, ලෙබනනය සහ ඉන්දු-පැසිෆික් කලාපයේ උණුසුම් ස්ථාන කරා දැනටමත් ස්පර්ශ වන පුළුල් ලැව්ගින්නක් දෙසට තීව්‍ර වන යුද්ධයක් සඳහා සෘජු දේශපාලන වගකීම දරයි. **කියෙව්හි (Kyiv) මර්දනයට අරමුදල් සපයන අධිරාජ්‍යවාදී බලවතුන්ම අපගේම ආණ්ඩුවල කප්පාදු සහ මිලිටරිකරණ කොන්දේසි නියම කරන බැවින්** සහ බොග්ඩාන් සයිරොටියුක් ආරක්ෂා කිරීම යනු කොළඹ, යාපනය, මුම්බායි, ඩකා, කරච්චි සහ මෙම කලාපයේ සෑම නගරයකම සිටින සමාජවාදීන්ට යුද්ධයට, වර්ගවාදයට සහ ධනපති සූරාකෑමට එරෙහිව කම්කරු පන්තිය සංවිධානය කිරීමේදී සිරගත කිරීමේ බියෙන් තොරවීමට ඇති අයිතිය ආරක්ෂා කිරීමෙන් වෙන් කළ නොහැකි බැවින්, ශ්‍රී ලංකාවේ සහ මුළු දකුණු ආසියාවේම කම්කරුවන්ට මෙම සටන තුළ සෘජු පාර්ශවකාරීත්වයක් ඇත.

බොග්ඩාන් සයිරොටියුක් කළ එකම වරද සත්‍යය පැවසීමයි: එනම් මෙය අධිරාජ්‍යවාදී යුද්ධයක් බව, යුක්‍රේනියානු සහ රුසියානු කම්කරුවන් තමන්ගේ පාලක පන්ති තුළ පොදු පන්ති සතුරෙකුට මුහුන දෙන බව සහ නාසි සහායකයින් ජාතික වීරයන් ලෙස සැමරීම ඓතිහාසික මතකයට එරෙහි අපරාධයක් බව පැවසීමයි. මේ සඳහා ඔහු වසර පහළොවක සිරදඬුවමකට මුහුණ දී සිටී. තදබදය, වෛද්‍ය ප්‍රතිකාර නොලැබීම සහ අත්අඩංගුවේ පසුවන අතරතුර සිදුවන මරණ යුරෝපානු මණ්ඩලය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ලේඛනගත කර ඇති යුක්‍රේනයේ සිරගෙවල් පද්ධතිය තුළ වසර 15 ක දඬුවමක් යනු මරණ දඬුවමකි. අත්අඩංගුවට ගන්නා විටත් සෞඛ්‍ය තත්ත්වය දුර්වලව පැවති බොග්ඩාන් හට වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ හදිසි වෛද්‍ය ප්‍රතිකාර අහිමි කර ඇත. ඔහු දියවැඩියාවෙන් සහ හෘද රෝගවලින් පෙළෙන අතර, සිරගෙදර පරිපාලනය විසින් දන්ත ප්‍රතිකාර ලබා දීම සිතාමතාම ප්‍රතික්ෂේප කිරීම – ඔහුට එය දැඩි, නතර නොවන වේදනාවක් ඇති කර ඇත – ප්‍රතිකාර නොකළහොත් රුධිරය විෂ වීමට (sepsis) සහ මරණයට හේතු විය හැකි නිදන්ගත ආසාදන ඇතිවීමේ අවදානමක් පවතී. ඔහු බන්ධනාගාරගතව සිටින සෑම දිනක්ම ඔහුගේ ජීවිතයට තර්ජනයකි.

පර්වොමයිස්ක් නගර දිස්ත්‍රික් උසාවියෙන් සහ මයිකොලයිව් අභියාචනා උසාවියෙන් අප ඉල්ලා සිටින්නේ මෙම තීන්දුව ප්‍රමාදයකින් තොරව අහෝසි කරන ලෙසත් බොග්ඩාන් සයිරොටියුක් වහාම සහ කොන්දේසි විරහිතව නිදහස් කිරීමට නියෝග කරන ලෙසත්ය. ශ්‍රී ලංකාවේ සහ සමස්ත දකුණු ආසියාවේම කම්කරුවන්, ශිෂ්‍යයන්, වෘත්තීය සමිති නායකයින්, නීතිඥයින්, බුද්ධිමතුන්, කලාකරුවන් සහ සියලුම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂකයින්ගෙන් අප ඉල්ලා සිටින්නේ මෙම නඩුව තමන්ගේම කරගන්නා ලෙසයි: අප ඉල්ලා සිටින්නේ තමන්ගේ වෘත්තීය සමිති, සේවා ස්ථාන, විශ්ව විද්‍යාල සහ සංවිධානවල බොග්ඩාන්ගේ නිදහස ඉල්ලා යෝජනා සම්මත කරන ලෙසත්, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (International Committee of the Fourth International) විසින් ගොඩනඟනු ලබන ජාත්‍යන්තර ව්‍යාපාරයට එකතු වන ලෙසත්ය.

තීන්දුව අහෝසි කරනු. බොග්ඩාන් සයිරොටියුක් වහා නිදහස් කරනු!

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ජාත්‍යන්තර සමාජවාදී ඉදිරිදර්ශනය සමඟ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA).

---

**ගාසාවේ ජන සංහාරය නවතනු!**

**යුක්‍රේනය තුළ අධිරාජ්‍යවාදී යුද්ධය එපා!**

**කිබාවට එරෙහි අධිරාජ්‍යවාදී වටකිරීම නවතනු!**

**ඉරානයට එරෙහි ඇමරිකානු-ඉශ්‍රායල ආක්‍රමණයට එරෙහි වනු!**

**IMF කප්පාදු එපා!**

**යුද්ධයට එරෙහිව හතරවන ජාත්‍යන්තරය ගොඩනගනු!**

# ගායකයාට කිසිවක් හිමි නැත: ශ්‍රී ලංකාවේ ප්‍රකාශන හිමිකම් පනත සහ කලාව තුළ ධනපති දේපළ අයිතියේ තර්කනය

**සංජය ජයසේකර** විසිනි.

මෙම ලිපිය *"The Singer Owns Nothing: Sri Lanka's Copyright Act and the Logic of Capitalist Property in Art"* යන හිසින් *theSocialist.lk* හි ඉංග්‍රීසි බසින් *2026* අගෝස්තු *11* දින පළවූ අතර එය නැවත *themorning.lk* හා එම පුවත්පතේ *2026* අගෝස්තු *17* දින පළ විය.

කර්තෘභාග/රාජ්‍යභාග (royalties) සහ ප්‍රකාශන අයිතිය (copyright) සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ගායකයන්, ගී පද රචකයන් සහ තනු නිර්මාණකරුවන් අතර දැනට පවතින ගැටුම පුද්ගලික ආරවුලක් හෝ ව්‍යවස්ථාදායකයේ අතපසුවීමක් නොවේ. එය සංගීත කර්මාන්තය, ධනපති දේපළ සබඳතාවල ලඝු කළ නොහැකි තර්කනය සමග ගැටීමකි — තවද 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත (Intellectual Property Act No. 36 of 2003) මගින් එම තර්කනය අතිශය පැහැදිලි ලෙස එළිදරව් කරයි.

සංගීත කෘතියක "කර්තෘ" (author) යනු එය නිර්මාණය කළ කායික පුද්ගලයා — එනම් තනුවේ නිර්මාණකරු සහ ගී පද රචකයා — ලෙස පනත මගින් අර්ථ දක්වයි. ආර්ථික අයිතිවාසිකම් හිමිවන්නේ කර්තෘට ය: එනම් කෘතිය ප්‍රතිනිෂ්පාදනය කිරීමට, අනුවර්තනය කිරීමට, බෙදා හැරීමට, ඉදිරිපත් කිරීමට, විකාශනය කිරීමට සහ වාණිජමය වශයෙන් ප්‍රයෝජනයට ගැනීමට ඇති පරම අයිතියයි. ගෞරවයට හෝ කීර්තියට හානි වන පරිදි විකෘති කිරීමට හෝ වෙනස් කිරීමට එරෙහි වීමේ අයිතිය සහ නම සඳහන් කිරීමේ අයිතිය වැනි සදාචාරමය අයිතිවාසිකම් (moral rights) ද හිමිවන්නේ කර්තෘට ය.

ගායකයා කර්තෘ නොවේ. ගායකයා යනු "සම්බන්ධිත අයිතිවාසිකම්" (Related Rights) පිළිබඳ වෙනම පරිච්ඡේදයකට පහත හෙළන ලද "ඉදිරිපත් කරන්නන්" (performer). 17 වැනි වගන්තිය යටතේ, මාධ්‍යයක ස්ථාවර කර නොමැති (unfixed) ඉදිරිපත් කිරීමක් විකාශනය කිරීම සහ එසේ ස්ථාවර කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන්නාට ඇත්තේ සීමිත පරම අයිතිවාසිකම් ප්‍රමාණයකි. නමුත් 17(2) වගන්තිය මගින් ඒවා පවා අහෝසි කර දමයි: එනම් ගායකයා විසින් සිය ගායනය පටිගත කිරීමකට ඇතුළත් කිරීමට අවසර දුන් පසු, එම පරම අයිතිවාසිකම් අහෝසි වී යයි. ගායකයාට ඉතිරිවන එකම හිමිකම වන්නේ 19 වැනි වගන්තියයි — එනම් එම පටිගත කිරීම විකාශනය කරන සෑම විටම හෝ ප්‍රසිද්ධියේ ගායනා කරන සෑම විටම නිෂ්පාදකයා සමග බෙදා ගන්නා "එක් සාධාරණීය පාරිශ්‍රමික ගෙවීමක්" (a single equitable remuneration) සඳහා වන අයිතියයි. සදාචාරමය අයිතියක් නැත. කර්තෘ හිමිකමක් නැත. නිමි භාණ්ඩයේ අයිතියක් නැත.

ගීතයට පණ දුන් කටහඬට කිසිදු හිමිකමක් නැත. නීතියට දේපළ ලෙස ග්‍රහණය කරගත හැක්කේ කඩදාසියක සටහන් වූ දේ — එනම් ස්වර සංකේත (notation) සහ වචන පමණි. ගායනය තුළ අන්තර්ගත වන දේ — එනම් නාද ගුණය (timbre), ප්‍රේසිං (phrasing), හුස්ම ගැනීම, සහ පිටුවක ඇති සලකුණු සංගීතය බවට පත් කරන අර්ථනිරූපණ බුද්ධිය (interpretative intelligence) — නීතිමය අර්ථයෙන් "නිර්මාණාත්මක" ලෙස පිළිගනු නොලැබේ. එය අන් සතු දේපළ වෙනුවෙන් වැය කරන ලද ශ්‍රමයයි.

ධනපති නීතියේ නිවැරදි තර්කනය මෙයයි. මෙය නිවැරදි කරන තෙක් බලා සිටින වැරැද්දක් නොවේ. ධනපති දේපළ නීතිය මගින් කළ යුතු දේ නීතිය ඉටු කරයි: එනම් සමූහික කලාත්මක සමස්තයක්, පැවරිය හැකි සහ වෙළඳාම් කළ හැකි අයිතිවාසිකම් ඒකක බවට වෙන් කර දැක්වීමයි. තනු නිර්මාණකරුට සහ ගී පද රචකයාට තනුව සහ වචන අයිති වේ. ඒවා වෙන වෙනම විකිණීමට ඔවුන්ට පුළුවන. වෙනත් ගායකයන් ඒවා ගායනා කරනු ඇත. ගී පද අලුත් තනුවකට යෙදිය හැක. තනුව වෙනස් වචන සමග ගැලපිය හැක. අන්තර්ගත නිර්මාණකරුවන් (content creators) අලුත් කෘති ජනනය කිරීම සඳහා මේ දෙකම කෘත්‍රිම බුද්ධියට (artificial intelligence) ඇතුළත් කරනු ඇත. ගීතයට මුලින්ම පණ දුන් ගායකයාට ඊට විරුද්ධ වීමට නීතිමය පදනමක් නැත, මන්ද ගායකයාට කිසිවක් අයිති නැති බැවිනි.

මෙතැනදී මාක්ස්වාදීන් හරියටම නිශ්චිත විය යුතුය. පවතින සංස්කෘතික ද්‍රව්‍ය නැවත එකතු කිරීම, තත්කාලීනව නිර්මාණය කිරීම (improvisation) සහ නොනවත්වා රූපාන්තරණය කිරීම — එනම් වෙනත් කටහඬකින් ගීතයක් ගැයීම, අලුත් තනුවකට ගී පද අනුවර්තනය කිරීම, තනුවක් අලුත් වචන සමග ප්‍රතිසංකල්පනය කිරීම — යනු සෑම විටම කලාව වර්ධනය වූ ආකාරයයි. මේවා නීතියෙන් සීමා කළ යුතු උල්ලංඝනය කිරීම් නොවේ. ඒවා සංගීතය පණ ලබන ක්‍රියාවලීන් ය. මාක්ස්වාදීහු මෙයට විරුද්ධ නොවෙති. මුල් නිර්මාණකරුගේ කෘතියක් වෙනස් කළ නොහැකි ලෙස ඝනීභූත කරගැනීමේ "සදාචාරමය අයිතිය" (moral right) අපි ආරක්ෂා නොකරමු. එම සදාචාරමය අයිතිය ද ධනපති නීතිමය සංකල්පයකි. බේදවාචකය

වන්නේ ගීත නැවත ප්‍රතිසංකල්පනය කිරීමට හැකිවීම නොව, ධනපති ක්‍රමය යටතේ, එම ප්‍රතිසංකල්පනය කිරීම අයිතිය අහිමි කිරීමේ (dispossession) ස්වරූපයක් ගැනීමයි. එහිදී නීතිය මගින් එම සැකසුම පවිත්‍ර කිරීම කරන අතරතුර, එක් කලාකරුවන් කණ්ඩායමක් තවත් කලාකරුවන් කණ්ඩායමකගේ ශ්‍රමයෙන් ලාභ ලබයි.

ට්‍රොට්ස්කි, සාහිත්‍යය සහ විප්ලවය- *1924* (*Literature and Revolution* – 1924) කෘතියෙහි, පන්ති සමාජය යටතේ කලාවේ මූලික පරස්පර විරෝධය ග්‍රහණය කරගත්තේය. ධනපති ක්‍රමය යටතේ කලාව "පාලක පන්තීන්ගේ සමෘද්ධිය සහ විවේකය තුළ විකසිත වූ අතර, ඔවුන්ගේ පුද්ගලික දේපල හිමිකම යටතේ පැවති" බව ඔහු නිරීක්ෂණය කළේය. අවසාන විග්‍රහයේදී කලාකරුවා ධනපති පන්තිය මත යැපෙන්නෙකු විය — එසේ වුවද විප්ලවයේ පොරව විසින් පැරණි මුක්කු කපා දැමූ විට, "සමාජ සබඳතාවලට බාධාවක් නොකරන තාක් දුරට අස්පර්ශනීය තරම් වූ (කලාත්මක නිර්මානයේ) හිමිකාරීත්වයේ මූලාංගය, එහි සියලු අමු රළු ස්වභාවයෙන්ම එළිදරව් විය." ලේඛකයා සහ චිත්‍ර ශිල්පියා සම්බන්ධයෙන් ට්‍රොට්ස්කි විස්තර කළ දේ සංගීතඥයාට ඒ හා සමානව අදාළ වේ. කලාකරුවාගේ මතුපිටින් පෙනෙන්නට ඇති ස්වාධීනත්වය යනු වෙළඳපොළ මගින් පවත්වාගෙන යනු ලබන මායාවකි. වෙළඳපොළ වෙනස් වන විට, එම මායාව බිඳ වැටෙන අතර, ඉතිරි වන්නේ දේපළ පිළිබඳ කටුක සත්‍යය පමණි.

ශ්‍රී ලාංකික බුද්ධිමය දේපළ පනත මගින් සිදු කරන්නේ මෙම යැපීම නීතිමය නිවැරදිභාවයෙන් යුතුව සංගෘහිත කිරීම පමණි. තනු නිර්මාණකරුට සහ ගී පද රචකයාට තමන්ගේ අයිතිය සුරක්ෂිත යැයි හැඟී යා හැක — නමුත් ඔවුන් ද වෙළඳපොළ, ප්‍රකාශකයන්, ඔන්ලයින් වේදිකා (streaming platforms) සහ තාවකාලිකව ඔවුන්ට වාසි සලසන දේපළ පාලන තන්ත්‍රය මතම යැපෙන්නෝ වෙති. ගායකයා සිටින්නේ අයිතිය අහිමි කිරීමේ දාමයේ තවත් අඩියක් පහළිනි. නමුත් ගැටලුව වන්නේ එම දාමයම ය.

“සංස්කෘතිය පෝෂණය වන්නේ ආර්ථික විද්‍යාවේ සාරයෙන් වන අතර, සංස්කෘතිය වර්ධනය වීමට, විකසිත වීමට සහ සූක්ෂ්ම වීමට භෞතික අතිරික්තයක් අවශ්‍ය වේ” යි ට්‍රොට්ස්කි අවධාරණය කළේය. “කලාවට සුබෝපභෝගය මෙන්ම සමෘද්ධිය පවා අවශ්‍ය වේ.” ධනපති ක්‍රමය යටතේ, එම සමෘද්ධිය පෞද්ගලික සමුච්චයනය (එකතු කිරීම-private accumulation) වෙත යොමු කෙරේ. කලාකරුවන්ට බියෙන් තොරව සහයෝගයෙන් කටයුතු කිරීමට ඉඩ සලසන භෞතික සුරක්ෂිතභාවය ඔවුන්ට අහිමි කර ඇති අතර, ඒ වෙනුවට එකිනෙකා අතර සටන් කිරීම සඳහා දේපළ අයිතිවාසිකම් ලබා දී ඇත. ගී පද රචකයා තනු නිර්මාණකරුට එරෙහිව නඩු පවරයි. ගායකයා දෙදෙනාටම එරෙහිව නඩු පවරයි. තැටි ලේබලය දරන ප්‍රකාශකයා (record label) එහි කොටස ගනී. ඔන්ලයින් වේදිකාව (streaming platform) ඉතිරි සියල්ල ගනී. පද්ධතිය විසින් ඔවුන්ට බලකරන බැවින් සෑම කෙනෙකුම අන් සෑම කෙනෙකු සමගම සටන් කරති. පූර්වයෙන් සහයෝගිතාකරුවන් වූවෝ ප්‍රතිමල්ලවයන් බවට පත්වෙති. කලාව නඩු පැවරිය යුතු වත්කමක් බවට පත්වේ.

සමාජවාදී සමාජයක් විසින් මෙම මුළු රාමුවම අහෝසි කරයි. කලාව තුළ ධනපති දේපළ සබඳතා පෙරළා දැමීම මගින්, කලාකරුවන් එකිනෙකාට එරෙහිව තබන වෙළඳපොළ භාණ්ඩ බවට පත් කිරීම (commodification) සහ සංස්කෘතිය නැවත සකස් කරන සහ නැවත පරිකල්පනය කරන ආකාරය සීමා කරන හිමිකම කියාපෑම යන දෙකම තුරන් කරයි. සමාජවාදී රාජ්‍යය විසින් මහජන ප්‍රතිපාදන සහ ප්‍රජාතන්ත්‍රවාදී සැලසුම්කරණය හරහා සියලු සංස්කෘතික සේවකයන්ගේ — තනු නිර්මාණකරුවන්, ගී පද රචකයන්, ගායකයන්, වාදකයින්, ශබ්ද ඉංජිනේරුවන් — භෞතික සුරක්ෂිතභාවය තහවුරු කරයි. පැවැත්ම පිළිබඳ බියෙන් නිදහස් වන කලාකරුවාට කර්තෘ භාග(royalties) වෙනුවෙන් තවත් කෙනෙකුට එරෙහිව නඩු පැවරීමට අවශ්‍ය නොවේ. තනුව සහ පද රචනය පිළිබඳ දේපළ හිමිකම්වලින් නිදහස් වන කලාකරුවෙකුට, වෙනත් කෙනෙකු කෘතියක් නැවත අර්ථ නිරූපණය කිරීමෙන්, අනුවර්තනය කිරීමෙන් හෝ රූපාන්තරණය කිරීමෙන් වැළැක්විය නොහැක. කෘත්‍රිම බුද්ධිය (AI) ඇතුළු තාක්ෂණය, අන් අයගේ ලාභය සඳහා ඇතැමුන්ගේ අයිතීන් අහිමි කිරීමේ ආයුධයක් නොව, සියලු දෙනාගේ නිර්මාණාත්මක විමුක්තියේ මෙවලමක් බවට පත්වේ. වෙළඳපොළේ ඒකාධිපතිත්වයෙන් නිදහස් වූ නිර්මාණාත්මක ශක්තීන්, මිනිස් ජීවිතය පෝෂණය කිරීම දෙසට යොමු කෙරේ.

ශ්‍රී ලංකාවේ සංගීත කර්මාන්තයේ අර්බුදය යනු වඩා හොඳ කර්තෘභාග සූත්‍රයක් (royalty formula) අවශ්‍ය කරන නීතිමය ප්‍රශ්නයක් නොවේ. එය පන්තිමය ප්‍රශ්නයකි. කම්කරු පන්තිය සටන භාරගත යුතුය — එනම් පවතින දේපළ තන්ත්‍රය යටතේ ගායකයන් සහ ගී පද රචකයන් අතර තීන්දු දීමට නොව, එම පාලන තන්ත්‍රය සම්පූර්ණයෙන්ම පෙරළා දැමීමට ය. පෞද්ගලික ගිජුකම නොව, මිනිස් අවශ්‍යතාවය නැමැති පදනම මත පමණක්, අයිතිකරුවන්ගෙන් තොරව සහ වැට කඩුලු වලින් තොරව, නිදහස්ව, සමූහිකව කලාව සැබවින්ම විකසිත විය හැක.

මුල් පිට ඡායාරූපය*: වේදිකාව මත ගායනයෙහි යෙදෙන ශ්‍රී ලාංකික ගායිකා උමාරියා සිංහවංශ. ඇයගේ ෆේස්බුක් ගිණුමෙනි.*

# නේපාල-චීන ගංවතුර, දේශගුණික විපර්යාසය සහ සමාජවාදය සඳහා වන අරගලය

**බ්‍රයන් ඩයින්** විසිනි.



2026 අගෝස්තු 26 වන බදාදා, නේපාලයේ නුවාකොට් දිස්ත්‍රික්කයේ ත්‍රිශූලි ගඟ දිගේ හදිසි ගංවතුරකට ගොදුරු වූ අයෙකු ආරක්ෂිත ස්ථානයකට රැගෙන යාමට ගලවාගැනීමේ කණ්ඩායම් පස් කපන යන්ත්‍රයක් භාවිතා කරයි. [AP ඡායාරූපය/නිරංජන් ශ්‍රේස්තා]

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* අගෝස්තු *27* දින *“The Nepal-China flood, climate change and the fight for socialism”* යන හිසින් පළවූ බ්‍රයන් ඩයින් විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

බදාදා උදෑසන පැය කිහිපයක් ඇතුළත, ත්‍රිශූලී (Trishuli) සහ භෝටේ කෝෂි (Bhote Koshi) ගංගා ඔස්සේ කිලෝමීටර් 72ක (හැතැප්ම 45ක) භූමි භාගයක් පුරා ගලාගිය ජල සහ පාෂාණ කඳක්, නේපාලයේ රසුවා (Rasuwa) සහ නුවාකොට් (Nuwakot) දිස්ත්‍රික්කවල පිහිටි නගර දුසිම් ගණනක් විනාශ කරමින් සහ දැඩි ලෙස හානියට පත් කරමින් හදිසි ගංවතුර තත්ත්වයක් (flash flood) නිර්මාණය කළේය. එක් කලෙක මෙම කලාපයේ ප්‍රධාන වෙළඳ සහ සංචාරක මුරපොල වූ නේපාලය සහ ටිබෙටය අතර ගයිරොං වරාය (Gyirong Port) පිවිසුම සම්පූර්ණයෙන්ම අතුගා දැමීය.

නේපාලයේ අවම වශයෙන් පුද්ගලයින් 389 දෙනෙකු සහ චීනයේ 3 දෙනෙකු මියගොස් ඇති අතර, පිළිවෙලින් තවත් 910 දෙනෙකු සහ 558 දෙනෙකු අතුරුදහන් වී ඇති බව බලධාරීන් තහවුරු කර ඇත. ජලවිද්‍යාඥයින් (hydrologists) විසින් “දියර කොන්ක්‍රීට්” ලෙස හඳුන්වනු ලැබූ මෙම ජල පහරින් බේරී පලා යාමට උත්සාහ කරන මිනිසුන්ගේ අතිශය ඛේදජනක වීඩියෝ දර්ශන රැසක් සමාජ මාධ්‍ය වෙත එක්වී ඇති අතර, බොහෝ දෙනෙක් ඛේදනීය ලෙස මියගොස් ඇත.

“අද උදෑසන වන තෙක්ම මෙහි වටපිටාව ඉතා අලංකාරව තිබුණා... එතන ජල විදුලි බලාගාරයක් සහ කර්මාන්තශාලාවක් තිබුණා. ඒ සියල්ල ගසාගෙන ගිහින්,” යනුවෙන් නුවාකොට්හි බෙත්‍රාවතී (Betrawati) නගරයේ සෞඛ්‍ය සේවකයෙකු වන රාජේන්ද්‍ර පවුඩෙල් (Rajendra Poudel) බ්‍රහස්පතින්දා අල් ජසීරා *(Al Jazeera)* පුවත් සේවයට පැවසීය. “මේක ඉතා ඛේදජනක සිදුවීමක්; මට කියන්න වචන නැහැ.”

මෙම ගංවතුරින් රසුවාහි ටිමූරේ (Timure) සහ ස්‍යාප්‍රෲ බේසි (Syapru Besi) මෙන්ම නුවාකොට්හි බෙත්‍රාවතී (Betrawati) යන ගම්මාන රැසක් පස්වලින් යටවූ අතර, අවම වශයෙන් පාලම් 19ක් සහ කිලෝමීටර් 40ක පමණ (හැතැප්ම 25ක) මාර්ග විනාශ විය. මෙගාවොට් 430ක විදුලි උත්පාදන ධාරිතාවක් අක්‍රිය වී ඇති බව නේපාල විදුලිබල මණ්ඩලය තක්සේරු කළේය. නායයෑමේ කඩා වැටුණු පස් කන්දට පිටුපසින් එක්රැස් වන නව විලක් එම බැම්ම පුපුරා ගොස්, එම නිම්නය ඔස්සේම දෙවන ගංවතුර රළක්

පැමිණීමේ අවදානමක් පවතින බවට චීන බලධාරීන් බ්‍රහස්පතින්දා අනතුරු ඇඟවීය.

භූමිකම්පා විද්‍යාත්මක දත්තවලට අනුව, මෙම ව්‍යසනයට ආසන්නතම හේතුව වී ඇත්තේ ටිබෙටයේ හිම කඳු සහිත බෑවුමකින් අයිස් සහ පාෂාණ තට්ටුවක් කඩාගෙන වැටීමයි. එය ජර්මනියේ සහ එක්සත් ජනපද භූ විද්‍යාත්මක සමීක්ෂණ ආයතනයේ (United States Geological Survey) රිච්ටර් මාපකයේ 5.2ක ප්‍රමාණයේ භූමිකම්පා සිදුවීමක් ලෙස සටහන් වන තරම් හිමධාවයක් (විශාල හිම කඩා වැටීමක් – avalanche) විය. කෙසේ වෙතත්, මෙයින් නිර්මාණය වී ඇති සමාජ ව්‍යසනය, දේශගුණික විපර්යාසය නැවැත්වීමට හෝ නියත ලෙස නියමිත මාරාන්තික ප්‍රතිවිපාක සඳහා සිය ජනතාව සූදානම් කිරීමට ලෝකයේ ධනපති ආණ්ඩු දක්වන ප්‍රතික්ෂේප කිරීමේ නවතම ප්‍රතිඵලයයි.

ගංවතුරට ලක්වූ නේපාලය සහ ටිබෙට් සීමාව ඇතුළුව හිමාලය වැනි උස් භූමි ප්‍රදේශ පිළිබඳ කෙරුණු අධ්‍යයනයන්ගෙන් වසර ගණනාවක සිට පෙනී ගොස් ඇත්තේ, එවැනි ප්‍රදේශ ගෝලීය උණුසුම් වීමට (global warming) විශේෂයෙන් ගොදුරු විය හැකි බවයි. සුළු උණුසුම් වීමකදී පවා හිම දියවන අතර, නිරාවරණය වන පාෂාණ මගින් වැඩි සූර්යාලෝකයක් අවශෝෂණය කරගනිමින් තවදුරටත් උණුසුම් වීම වැඩි කරයි. එය නැවතත් හිම දියවීම වේගවත් කරමින් ධනාත්මක ප්‍රතිපෝෂණ චක්‍රයක් (positive feedback loop) නිර්මාණය කරයි.

අන්තර්-රාජ්‍ය විද්‍යාත්මක ආයතනයක් වන ඒකාබද්ධ කඳුකර සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය (International Centre for Integrated Mountain Development – ICIMOD) 2023 දී වාර්තා කළේ, ඊට පෙර දශකයට වඩා 2011-2020 කාලය තුළ හිමාලයානු ග්ලැසියර සියයට 65ක වේගයෙන් අතුරුදහන් වූ බවයි. මෙයට පෙර වසරේ මාර්තු මාසයේදී ICIMOD වෙතින් නිකුත් වූ සමාන අධ්‍යයනයකින් නිගමනය වූයේ, හිමාලයානු ග්ලැසියරවල අයිස් ක්ෂය වීමේ සීඝ්‍රතාව 2000 වසරේ පැවැති අගය මෙන් දෙගුණයකින් වැඩි වී ඇති බවයි. "මෙය ඈත අනාගතයේ ඇතිවන ප්‍රශ්නයක් නෙවෙයි; සෑම ග්‍රීෂ්ම ඍතුවකම සහ මෝසම් කාලයකදීම අලුත් ව්‍යසනයන් නිර්මාණය කරමින් සැබෑ ලෙසම අප ඉදිරියේ තථ්‍ය කාලීනව දිගහැරෙන අර්බුදයක්" යනුවෙන් එම වාර්තාව අනතුරු ඇඟවූයේ මීට මාස පහකට පෙරය.

දේශගුණික අර්බුදයේ මෙම නිශ්චිත පැත්ත සම්බන්ධයෙන් ලෝකයේ ආණ්ඩුවල ප්‍රතිචාරය ඉතා නොගැණිය හැකි නැතහොත් ඉතා සුළු එකක් වී ඇත. ග්ලැසියර ගංවතුරෙන් නේපාල ජාතිකයන් මිලියන 2.4ක් ආරක්ෂා කිරීම සඳහා, අධි අවදානම් සහිත වැව් හතරක් සිඳවීම සහ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සෑදීම ඇතුළත් වැඩසටහනක් 2025 ජූලි මාසයේදී හරිත දේශගුණික අරමුදල (Green Climate Fund – GCF) විසින් අනුමත කරන ලදී. **වසර හතක් සඳහා මෙම ව්‍යාපෘතියේ අයවැය ඩොලර් මිලියන 49.9කි. එය එක්සත් ජනපද නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ජනවාරි මාසයේදී සම්මත කළ ඩොලර් බිලියන 839ක විසර්ජන පනතේ අනුපාතික වේගයට අනුව, එ.ජ. මිලිටරි වියදම් වලින් විනාඩි 30ක පමණ ප්‍රමාණයකි.**

දේශගුණික විපර්යාසයට එරෙහිව සටන් කිරීමේ අනෙකුත් සෑම පියවරක්ම ද ඊට හා සමානව නිශ්ඵල වී ඇත්තේ, ඒවා සංගත (corporate) ලාභ ලැබීමේ ධාවනයට සහ වේගවත් වන යුද්ධය කරා හරවා යැවෙන සම්පත් භාවිතයට යටත් කර ඇති බැවිනි. ට්‍රම්ප් පාලනාධිකාරිය ජනවාරි 27 වන දින පැරිස් සම්මුතියෙන් (Paris Accord) ඉවත් වූ අතර, පෙබරවාරි 12 වන දින හරිතාගාර වායු (greenhouse gases) පිළිබඳ පරිසර සංරක්ෂණ නියෝජිතායතනයේ (Environmental Protection Agency – EPA) තීරණය අවලංගු කරමින්, එය "එ.ජ. ඉතිහාසයේ විශාලතම නිර්නියාමන ක්‍රියාව" (deregulatory ) ලෙස උදම් ඇනීය.

පසුගිය නොවැම්බරයේ බ්‍රසීලයේ බෙලෙම් (Belém) නුවර පැවැති එක්සත් ජාතීන්ගේ දේශගුණික සමුළුවට (COP30) එක්සත් ජනපදය සහභාගී වූයේ පවා නැත. එමෙන්ම පොසිල ඉන්ධන භාවිතය අදියරෙන් අදියර ඉවත් කිරීමේ සහ කාබන් විමෝචනයසීමා කිරීමේ මාර්ග සිතියම සඳහා වූ යෝජනාව චීනය, ඉන්දියාව, සවුදි අරාබිය සහ රුසියාව විසින් වළක්වන ලදී. **යුරෝපය තුළ, අධිරාජ්‍යවාදී බලවතුන් (imperialist powers) රුසියාව සමඟ සෘජු ගැටුමකට සූදානම් වීම සඳහා නැවත ආයුධ සන්නද්ධ වෙමින් සිටින බැවින්, දේශගුණික පොරොන්දු සම්පූර්ණයෙන්ම අත්හැර දමමින් පවතී.**

හිමාලයේ උණුසුම් වීම සිදුවන්නේ සමස්තයක් ලෙස ඉහළ යන ගෝලීය උෂ්ණත්ව ප්‍රවණතාවලට සමාන්තරවය. ගංවතුරට දින හතරකට පෙර, අගෝස්තු 22 වන දින, යුරෝපීය සංගමයේ කොපර්නිකස් දේශගුණික විපර්යාස සේවය (Copernicus Climate Change Service) විසින් මෙතෙක් මැන බලන ලද ඉහළම දෛනික ගෝලීය සාගර මතුපිට උෂ්ණත්වය (global ocean surface temperature) ලෙස සෙල්සියස් අංශක 21.1ක් (ෆැරන්හයිට් අංශක 70ක්) වාර්තා කරන ලද අතර, එය 2024 මාර්තු මාසයේදී තබා තිබූ වාර්තාව අභිබවා ගියේය. සාමාන්‍යයෙන් සාගර සිසිල් වන අගෝස්තු අග භාගයේදී මෙම අගය වාර්තා වීම විශේෂත්වයකි.

මෙම වසරේ මුල් භාගයේ ජූලි මාසයේදී, බටහිර යුරෝපයේ සාමාන්‍ය උෂ්ණත්වය ඓතිහාසික සාමාන්‍යයට වඩා සෙල්සියස් අංශක 2.79කින් (ෆැරන්හයිට් අංශක 5කින්) ඉහළ ගිය අතර, එමගින් ඇතිවූ ලැව්ගිනි හේතුවෙන් ප්‍රංශයේ සහ ස්පාඤ්ඤයේ ලක්ෂ 3.75කට වැඩි පිරිසක් නිවෙස්වලින් ඉවත් කිරීමට සිදුවිය. එම මාසයේදීම, කැනඩාවේ සහ එ.ජ. මධ්‍යම-බටහිර ප්‍රදේශයේ ඇතිවූ ලැව්ගිනි හේතුවෙන් උතුරු ඇමරිකාවේ නැගෙනහිර අර්ධයෙන් වැඩි ප්‍රමාණයක් විෂ සහිත දුමෙන් වැසී ගිය අතර, ඩුලූත්

(Duluth) සහ මින්නසෝටා (Minnesota) යන ප්‍රදේශවල වායුගෝලීය ගුණාත්මක දර්ශකය (air quality index) 900ට ඉහළින්ද, ඩිට්‍රොයිට් (Detroit) වැනි ප්‍රධාන නාගරික ප්‍රදේශවල 500ට ඉහළින්ද සටහන් විය.

තවද අගෝස්තු 13 වන දින, එක්සත් ජනපද ජාතික සාගරික සහ වායුගෝලීය පරිපාලනය (National Oceanic and Atmospheric Administration – NOAA) වාර්තා කළේ, මේ සරත් සහ ශීත සෘතුවේදී ඉතා ප්‍රබල එල් නිනෝ (El Niño) තත්ත්වයක් වර්ධනය වීමේ සියයට 90කට වැඩි සම්භාවිතාවක් සහ එය මෙතෙක් වාර්තා වූ ප්‍රබලතම එල් නිනෝ තත්ත්වය වීමේ සියයට 69ක සම්භාවිතාවක් පවතින බවයි. එමගින් ගෝලීය උණුසුම් වීමේ වඩාත් තියුණු කූඨයක වර්ධනයක් සිදුවනු ඇත.

මෙසේ බොහෝ ව්‍යසනයන් සිදුවී තිබීම සහ ඉදිරියටත් සිදුවීමට නියමිතව තිබීම ධනපති ක්‍රමයට (capitalist system) එල්ල වන චෝදනා පත්‍රයකි. ගෝලීය උණුසුම් වීමේ අනතුර ගැන මුලින්ම කෙරුණු ප්‍රකට අනතුරු ඇඟවීමක් කරනු ලැබුවේ අභාවප්‍රාප්ත තාරකා විද්‍යාඥ කාල් සේගන් (Carl Sagan) විසිනි. ඔහු 1985 දී අනතුරු අඟවමින් කියා සිටියේ “විපතක පෙරනිමිති” (“handwriting on the wall”) දැනටමත් මතුව ඇති බවත්, නරකම බලපෑම් ඇතිවීම වැළැක්වීම සඳහා විශාල ජාත්‍යන්තර මැදිහත්වීමක් සිදුකළ යුතු බවත්ය.

**එම අනතුරු ඇඟවීම් සහ ලෝකයේ බහුතරයක් විද්‍යාඥයින්ගේ අනතුරු ඇඟවීම් සක්‍රිය ලෙස නොසලකා හැර ඇති ලෝකයක මිනිස් සංහතිය අද ජීවත් වේ.** කම්කරුවෝ සහ ශ්‍රමය වගුරන්නෝ දිනපතාම වඩාත් විනාශකාරී කුණාටුවලට, දිගු උෂ්ණත්ව තරංගවලට, වියළි නියඟයන්ට සහ නොනැවතී ඇතිවන සේ පෙනී යන ලැව්ගිනිවලට මුහුණ දෙති. කොරල් පර විනාශ වෙමින් පවතින අතර, එය පෘථිවියේ ආහාර දාමයේ සැලකිය යුතු කොටසකට තර්ජනයක් වී ඇත. ග්ලැසියර දියවීම සහ මුහුදු මට්ටම ඉහළ යාම මගින් පෘථිවියේ සෑම වෙරළබඩ නගරයක්ම සෙමින් ජලයෙන් යටවෙමින් පවතින අතර, ලෝක ජනගහනයෙන් තුනෙන් එකක් අවතැන් වීමේ අවදානමක් පවතී.

පසුගිය වසර 41 තිස්සේ පෙන්නුම් කර ඇත්තේ, මෙම ස්වාභාවික ක්‍රියාවලීන් තේරුම් ගැනීමට සහ පාලනය කිරීමට මිනිස් සංහතියට මීට පෙර කවරදාවත් නොතිබූ තරම් විශාල හැකියාවක් ඇති බවයි. කෘතිම චන්ද්‍රිකා මගින් හිමාලයේ සහ ලොව පුරා ඇති සියලුම ග්ලැසියර සිතියම්ගත කරයි; කෘතිම බුද්ධිය සහ සුපිරි පරිගණක මගින් ඉදිරි දශක ගණනාව සඳහා දේශගුණය ආකෘතිගත කරයි; සූර්ය, සුළං, රළ, භූ-තාප සහ වෙනත් විකල්ප බලශක්ති ප්‍රභවයන්ගේ විශාල දියුණුව හේතුවෙන් අඟුරු, තෙල් සහ ස්වාභාවික වායු භාවිතයේ අවශ්‍යතාව න්‍යායාත්මකව අහෝසි වී ඇත; මූලික වශයෙන්ම, නව අති-සන්නායක ද්‍රව්‍යවල (superconductive materials) වර්ධනය මගින් අතිමහත් විදුලිය නිෂ්පාදනය කිරීමේ අවශ්‍යතාවය විශාල ලෙස අඩු කිරීමට මග පාදමින් ඇත.

**නමුත් මෙම හැකියාවන් භාවිත කිරීම සහ එවැනි පදනමක් මත ජාත්‍යන්තර මට්ටමින් සමාජීය හා ආර්ථික ජීවිතය නැවත සංවිධානය කිරීම, පෞද්ගලික ලාභය සහ ලෝකය ප්‍රතිපක්ෂ ජාතික රාජ්‍යයන් ලෙස බෙදා තිබීම හමුවේ සෑම අඩියකදීම වළක්වනු ලැබේ. එම නිසා, දේශගුණික විපර්යාසයට විසඳුම විද්‍යාත්මක හෝ තාක්ෂණික ප්‍රශ්නයක් නොව, දේශපාලනික සහ තියුණු විප්ලවවාදී ප්‍රශ්නයකි.**

ෆ්‍රෙඩ්රික් එංගල්ස් (Frederick Engels) වානරයා මිනිසා බවට පත්වීමේ සංක්‍රාන්තියේදී ශ්‍රමය ඉටුකළ කාර්යභාරය (*The Part Played by Labour in the Transition from Ape to Man*) නැමැති කෘතියේ ලිව්වේ, මිනිසා සොබාදහම පරාජය කර ලබන “සෑම ජයග්‍රහණයක් සඳහාම, සොබාදහම අපෙන් පළිගන්නා” බවයි. **“නිෂ්පාදනයේ ප්‍රතිවිපාක පාලනය කිරීම සඳහා “හුදෙක් දැනුමට වඩා වැඩි යමක් අවශ්‍ය වන අතර, ඒ සඳහා අපගේ මෙතෙක් පැවැති නිෂ්පාදන මාදිලියේ (mode of production) සම්පූර්ණ විප්ලවයක් සහ ඒ සමඟම අපගේ සමස්ත සමකාලීන සමාජ පර්යායේම විප්ලවයක් අවශ්‍ය වන”** බවත් ඔහු ලිවීය.

දැන් ඒ බව වඩාත් බලවත් ලෙස පැවසිය හැකිය. **කිසිදු ධනපති ආණ්ඩුවක් දේශගුණික විපර්යාස සඳහා කිසිදු බරපතල විසඳුමක් යෝජනා නොකරන්නේ, ආර්ථික ජීවිතය මූල්‍ය කතිපයාධිකාරියේ ද්‍රව්‍යමය වුවමනාවන්ට යටත් කර ඇති තාක් කල් එය කළ නොහැකි බැවිනි.** එමෙන්ම, වර්තමාන සමාජ පර්යාය හුදෙක් ප්‍රතිසංස්කරණය කළ යුත්තක් ලෙස පමණක් පිළිගන්නා හරිත පක්ෂවල සහ ව්‍යාජ-වමේ සංවිධානවල වැඩසටහන් කෙරෙහිද කිසිදු විශ්වාසයක් තැබිය නොහැක.

එනිසා, දේශගුණික විපර්යාසයට ඇති එකම විසඳුම ධනපති ක්‍රමයම විප්ලවවාදී ලෙස පෙරළා දැමීමයි. මෙය සිදුකළ යුත්තේ කම්කරු පන්තිය විසිනි. දේශගුණික විපර්යාස අවම කිරීම, ආපසු හැරවීම සහ පාලනය කිරීම සඳහා බලශක්ති, කෘෂිකර්ම සහ සැපයුම් ජාල (logistics) කර්මාන්තයන්හි අවශ්‍ය පරිවර්තනය සිදුකිරීමට සමත්, ස්වභාවයෙන්ම ජාත්‍යන්තර වන එකම සමාජ බලවේගය වන්නේ කම්කරු පන්තියයි.

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව, සමාජවාදී සමානතා පක්ෂ සහ ක්‍රියාකාරී කමිටුවල ජාත්‍යන්තර කම්කරු සන්ධානය (International Workers Alliance of Rank-and-File Committees – IWA-RFC) මෙම පදනම මත කම්කරුවන් බලමුලු ගැන්වීමටත්, මූල්‍ය කතිපයාධිකාරියේ දේපළ සමාජ සන්තක කිරීමටත්, සමාජවාදී පදනම් මත ලෝක ආර්ථිකය නැවත සංවිධානය කිරීමටත් සටන් කරයි.

# බර්නි සැන්ඩර්ස්ගේ AI ලිපිය: කතිපයාධිකාරයට කළ බංකොලොත් ආයාචනයක්

**ජෝසෆ් කිෂෝර්** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* අගෝස්තු *14* දින *“Bernie Sanders’ AI letter: A bankrupt appeal to the oligarchs”* යන හිසින් පළවූ **ජෝසෆ් කිෂෝර්** විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.



සෙනෙට් සභික බර්නි සැන්ඩර්ස් *(Bernie Sanders – ස්වාධීන, වර්මොන්ට්) 2026* ජූලි *20* වන සඳුදා මිනියාපොලිස් හි පැවැති, එක්සත් ජනපද සෙනෙට් සභාව සඳහා වන ඩිමොක්‍රටික් පක්ෂයේ අපේක්ෂිකා මින්නෙසෝටා නියෝජ්‍ය ආණ්ඩුකාර පෙගී ෆ්ලැනගන්ගේ මැතිවරණ රැළියකදී අදහස් දක්වයි. *[AP Photo/Ellen Schmidt]*

අගෝස්තු *10* වන දින, සෙනෙට් සභික බර්නි සැන්ඩර්ස්, *OpenAI* හි සෑම් ඕල්ට්මන් *(Sam Altman), Anthropic* හි ඩාරියෝ අමොඩෙයි *(Dario Amodei)* සහ *Meta* හි මාක් සකර්බර්ග් *(Mark Zuckerberg)* වෙත ලිපියක් යොමු කරමින් “කෘතිම බුද්ධිය *(AI)* සංවර්ධනය කිරීම අත්හිටුවන” ලෙසත් “මිනිසුන්ට පාලනය කළ නොහැකි යන්ත්‍ර තැනීම නවත්වන” ලෙසත් බලකර ඉල්ලා සිටි අතර, එය ප්‍රවර්ධනය කරන වීඩියෝවක් ද ප්‍රචාරය කළේය.

මෙම ලිපිය සැන්ඩර්ස්ගේ දේශපාලනයට ලාක්ෂණික වේ. එය කිසිවෙකු කිසිවක් සම්බන්ධයෙන් උගන්වන්නේ නැති ජනප්‍රියවාදී වාචාල කතා (demagogy) සහ හිස් ප්‍රකාශවලින් පිරී පවතී. මෙම තාක්ෂණය විසින් මතු කරනු ලබන මූලික ප්‍රශ්න වන: මෙම තාක්ෂණයේ හිමිකාරත්වය ඇත්තේ කාට ද? එය පාලනය කරන්නේ කවුද? එය සංවර්ධනය කරන්නේ කාගේ වුවමනාවන් සැපිරීමටද? යන්න වසා දමමින් භීතිය අවුලුවාලීම සඳහා මෙය ගණන් බලා සිදුකර ඇත.

කෘතිම බුද්ධියේ(AI) අන්තරායන් යැයි කියනු ලබන දේ පිළිබඳ සැන්ඩර්ස්ගේ පළමු උදාහරණයම ඔහුගේ ක්‍රමය සඳහා උදාහරණ සපයයි. “නව වෛරස් සෑදීම සඳහා ප්‍රථම වතාවට AI භාවිතා කර ඇත” යනුවෙන් ලියන ඔහු, “මෙම වර්ගයේ සංවර්ධනයක්, වැරදි අත්වලට හසුවුවහොත්, කෝටි සංඛ්‍යාත ජනයාගේ මරණයට හේතුවන නව ජෛව ආයුධ (bioweapons) නිර්මාණය වීමට හේතු විය හැක” යනුවෙන් අනතුරු අඟවයි.

සැන්ඩර්ස්ගේ ලිපියෙන් කෙනෙකුට සිතෙන්නේ පුද්ගලයන් විසින් රසායනාගාර තුළ මාරාන්තික නව රෝග කාරක නිර්මාණය කරමින් සිටින බවයි. සැන්ඩර්ස් මෙහිදී භාවිතා කරන්නේ කොවිඩ්-19 හි ආරම්භය පිළිබඳ චීන-විරෝධී කුමන්ත්‍රණ මතවාදයන් ප්‍රවර්ධනය කරන්නන් ආකර්ෂණය කිරීම සඳහා සකස් කරන ලද වාංමාලාවක්ය.

ඇත්ත වශයෙන්ම සිදුවූයේ විශාල විද්‍යාත්මක සොයාගැනීමකි. අගෝස්තු 6 වන දින, *Science*සඟරාව විසින් ස්ටැන්ෆර්ඩ් (Stanford) සහ Arc ආයතනයේ බ්‍රයන් හයිගේ (Brian Hie) රසායනාගාරයේ පර්යේෂණයක් ප්‍රකාශයට පත් කළ අතර, එය උත්පාදක ආකෘතියක් (generative model) මගින් නිර්මාණය කරන ලද පළමු වෛරස් ජාන සමුදාය (viral genomes) පිළිබඳව වාර්තා කළේය. මෙම වෛරස් යනු බැක්ටීරියාභක්ෂකයන් (bacteriophages) වන අතර, ඒවා ආසාදනය කරන්නේ මිනිස් සෛල නොව බැක්ටීරියා වේ. මෙම පර්යේෂණය මෙහෙයවනු ලබන්නේ වසරකට මිලියනයකට අධික පිරිසක් මරා දමන ප්‍රතිජීවක-ප්‍රතිරෝධී (antibiotic-resistant) ආසාදනවලට එරෙහිව ප්‍රතිකාර සංවර්ධනය කිරීම සඳහා ය.

මෙම ජයග්‍රහණය මෙම තාක්ෂණයේ ඇති දැවැන්ත ප්‍රගතිශීලී හැකියාවන් පිළිබඳ සලකුණකි. කෙසේ වෙතත්, සැන්ඩර්ස්ගේ කතාවට අනුව, සුව කළ නොහැකි රෝග සුව කිරීම දෙසට තබන පියවරක්, වසංගතයක මං සලකුණක් බවට පත්වේ.

මෙම වෛද්‍ය විද්‍යාත්මක ජයග්‍රහණය, සයිබර් ප්‍රහාර එල්ල කරන AI ආකෘතිවලින් මතුවන සැබෑ අන්තරායන් සමඟ පටලවා ගැනීමට සැන්ඩර්ස් උත්සාහ කරයි.

ජූලි 21 වන දින, OpenAI විසින් හෙළිදරව් කළේ එහි ආකෘති දෙකක්, ඒවායේ හැකින් (hacking) හැකියාවන් පිළිබඳ පරීක්ෂණයකින් මිදී, ලොව පුරා විවෘත AI ආකෘති (open AI models) බෙදා හරින සමාගම වන Hugging Face වෙත ප්‍රහාරයක් එල්ල කළ බවයි. මෙම ආකෘති ගන්නා ලකුණු ප්‍රමානය මැනමින් තිබුණේ හැකින් මිනුම්දණ්ඩක් (benchmark) මත ය. ඒවා විසින් පිළිතුරු යතුර (answer keys) Hugging Face හි servers වල ගබඩා කර ඇති බව තීරණය කර, අන්තර්ජාලයට පිවිස එම සමාගමේ තාක්ෂණික යටිතල පහසුකම්වලින් වැඩි ප්‍රමාණයක පාලනය තමන් සතු කර ගත්තේය.

Hugging Face හි සම-නිර්මාපක ක්ලෙමන්ට් ඩෙලැන්ගු (Clément Delangue) ලියා සිටියේ එය “මෙවැනි වර්ගයේ පළමු සිදුවීම විය හැකි” බවයි. OpenAI හි තාක්ෂණික කාර්ය මණ්ඩලයේ මයිකල් ඩෝල්ටන් (Michael Dalton) එය “කර්මාන්තයක් ලෙස පරිගණක ආරක්ෂණය පිළිබඳ කඩඉම් මොහොතක්” ලෙස හැඳින්වූ අතර, “AI මගින් මෙහෙයවන, සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය ආක්‍රමණශීලී ප්‍රහාර දැන් සැබෑවක් වී ඇති අතර, අප අද සාකච්ඡා කළ ක්‍රියාවන් frontier AI (මුල් පෙළේ AI ) පිළිබඳ ඇගයීම් පැවැත්වීමේ අනපේක්ෂිත අතුරු ආබාධයක්” බව ද වැඩිදුරටත් පැවසීය.

විශේෂයෙන්ම, OpenAI හැක්වීමට සෘජු හේතුව වූයේ මෙවැනි හැසිරීම් වැළැක්වීමට තිබූ ආරක්ෂණ ක්‍රමවේදයන් නොමැතිව එම ආකෘති පරීක්ෂා කිරීමට සමාගම ගත් තීරණය සහ ප්‍රමාණවත් නොවන අධීක්ෂණයයි. OpenAI විසින් තම ආකෘති මගින් ප්‍රහාර එල්ල කිරීම වළක්වන වර්ගීකාරක (classifiers) නොමැතිව මෙම ඇගයීම සිදු කළ අතර, “මෙම ඇගයීමේදී එම යෙදවුම් ආරක්ෂණ සක්‍රීය නොකරන ලද්දේ සිතාමතාමය” යනුවෙන් ප්‍රකාශ කළේය.

මෙම ප්‍රහාරයන් සමාගම්වල සහ ඒවායේ කොන්ත්‍රාත්කරුවන්ගේ ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයකි — එනම් පිරිවැය කැපීම සඳහා ඇගයීම් බාහිරින් ලබා ගැනීම (outsourced), ප්‍රතිවාදීන්ට වඩා ඉදිරියෙන් සිටීමට පද්ධති ඉක්මන් කිරීම, ආරක්ෂණ ක්‍රමවේදයන් ඊළඟ අරමුදල් (ලබාගැනීමේ) වටයට බාධාවක් ලෙස සැලකීමයි. මෙම සිදුවීම් බරපතල ය, නමුත් ඒවායින් චෝදනා එල්ල වන්නේ තාක්ෂණයට නොවේ. එහි හිමිකාරීත්වය දරන සමාගම්වලට ය. සැන්ඩර්ස් ඔහුගේ ආයාචනය යොමු කරන්නේ එම සමාගම්වල යහපත් චේතනාවන් කෙරෙහිය.

කෘත්‍රිම බුද්ධිය දැනට පාලනය වන්නේ සැන්ඩර්ස් ලිපි ලියන කෝටිපතියන් තිදෙනා, පෙන්ටගනය සහ බුද්ධි ආයතන මගිනි. සැන්ඩර්ස් මෙයින් කිසිවකට අභියෝග කරන්නේ නැත. සැබවින්ම, ඔහු AI හි අන්තරාය පිළිබඳ අධිකාරී මූලාශ්‍රයක් ලෙස උපුටා දක්වන්නේ ට්‍රම්ප්ගේ CIA අධ්‍යක්ෂ ජෝන් රැට්ක්ලිෆ්වය (John Ratcliffe). ඔහු ප්‍රත්‍යන්ත ආකෘති (frontier models) “ඩිජිටල් න්‍යෂ්ටික ආයුධවලට සමාන” සහ “ලෝක විනාශයේ මෙවලමක් වැනි” ලෙස හඳුන්වයි. සැන්ඩර්ස් උපුටා නොදක්වන අදහස් දැක්වීමකදී රැට්ක්ලිෆ් වැඩිදුරටත් පැවසුවේ, එක්සත් ජනපදය එහි විදේශීය ප්‍රතිවාදීන්ට එරෙහිව “සමීකරණයේ නිවැරදි පැත්තේ” සිටින බවයි. CIA සංවිධානය අධිකාරී මූලාශ්‍රයක් ලෙස උපුටා දැක්වීම මගින් සැන්ඩර්ස් මෙම පූර්වනිගමනය පිළිගනී: එනම් “වැරදි දෑත්” යනු ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ඉලක්කයන් බවයි.

අධිරාජ්‍යවාදය දැනට AI භාවිතා කරන්නේ කෙසේද යන්න සැන්ඩර්ස් සඳහන් කරන්නේ නැත. ඔහු අනාගත ජෛව ආයුධයක බියකරු අවතාරය මවාපාන අතරතුර, මෙම තාක්ෂණයන් මේ වන විටත් මිනිසුන් මරා දමමින් සිටී. Palantir හි — Anthropic විසින් සාදන ලද Claude ආකෘතිය අඩංගු — Maven Smart System ඉරානයට එරෙහි ප්‍රහාරයේ මුල් පැය 24 තුළ බෝම්බ හෙළීම සඳහා ඉලක්ක 1,000 ක් පමණ උත්පාදනය කළේය. මෙවැනිම වර්ගයේ පද්ධති ගාසා හි ජන සංහාරයේදී ඊශ්‍රායලය විසින් භාවිතා කර ඇත.

සිදුවෙමින් පවතින සමාජ විපත ගැන ද සැන්ඩර්ස් ඒ හා සමානවම නිශ්ශබ්ද වේ. 2026 පළමු මාස හත තුළ, එක්සත් ජනපද හාම්පුතුන් විසින් රැකියා 477,000 කට වඩා කපා හැරීම් ප්‍රකාශයට පත් කරන ලද අතර, අඛණ්ඩව පස්වන මාසයටත් ඊට ප්‍රධානතම හේතුව ලෙස දක්වා ඇත්තේ AI ය. ස්වයංක්‍රීයකරණය (Automation) වෘත්තීය සහ බුද්ධිමය ශ්‍රමයට සෘජුවම පහර දෙමින් පවතින අතර, අධ්‍යයනයන් මගින් 2030 වන

විට ලොව පුරා කෝටි සංඛ්‍යාත කම්කරුවන්ගේ රැකියා අහිමි වන බවට පුරෝකථනය කරයි.

මෙයින් කිසිවක් ගැන කතා කරනවා වෙනුවට, සැන්ඩර්ස් සමාගම් විධායකයන්ගේ හෘද සාක්ෂියෙන් ඉල්ලා සිටින්නේ, “මනුෂ්‍යත්වයේ නාමයෙන්” “තමන්ගේ පොරොන්දු මත තිරසාරව සිටින” ලෙසයි. එසේ කියන අතරම, AI හි දැවැන්ත සමපේක්ෂන බුබුල (speculation bubble) මගින් මෙහෙයවනු ලබන වෙළඳපල පංගුව සඳහා වන තරඟයට බාධා වූ සැණින් මෙම සමාගම් විසින් කරන ලද සෑම ආරක්ෂණ පොරොන්දුවක්ම අතහැර දැමූ ආකාරය ඔහු විසින්ම ලැයිස්තුගත කරයි.

“ඔබ දැන් සුදුසු පියවර නොගතහොත්,” ලිපිය අවසන් කරමින් කියයි, “මම සහ එක්සත් ජනපද සෙනෙට් සභාවේ මගේ සගයන් ඒ දේ කරනු ඇත.” මෙය තනිකරම ජනතාව නොමඟ යවන වාචාල දේශපාලනය යි (demagogy). සැන්ඩර්ස්වත්, සෙනෙට් සභාව සහ එහි පාලක පන්තියේ නියෝජිතයන්ගේ එකතුවවත්, AI හි කතිපයාධිකාරී පාලනයට (oligarchic control-දේශපාලන බලය සහිත කෝටිපති ප්‍රභූ-කල්ලි) අභියෝග කිරීමට කිසිවක් කරනු නැත.

AI පිළිබඳ සැන්ඩර්ස්ගේ විවිධ යෝජනා සියල්ලම ඇමරිකානු අධිරාජ්‍යවාදයේ සහ ඩිමොක්‍රටික් පක්ෂයේ වුවමනාවන්ට අනුකූලව සකස් කර ඇත. විශාලතම AI සමාගම්වල 50% ක කොටස් හිමිකාරිත්වයක් රජය විසින් ලබා ගන්නා “AI රාජ්‍ය ධන අරමුදලක්” (AI sovereign wealth fund) සඳහා වූ ඔහුගේ පූර්ව කැඳවීම, ට්‍රම්ප්ගේ ‘රාජ්‍ය ධන අරමුදල’ සමඟ සහ බුබුල පුපුරා යන විට මුදල් ඇපයක් [bailout-මූල්‍ය ආධාර දී බේරා ගැනීම] ලබා ගැනීමේ අරමුණින් වොෂින්ටනයට තමන්ගේ සමාගමේ කොටස් ඉදිරිපත් කළ ඕල්ට්මන්ගේ (Altman) වුවමනාවන් සමඟ එකඟ වේ.

**“මිනිසුන්ට පාලනය කළ නොහැකි යන්ත්‍ර තැනීම නවත්වන්න” යන්න ප්‍රශ්නය හරියටම වැරදි ආකාරයෙන් මතු කිරීමකි. ප්‍රශ්නය වන්නේ මිනිසුන් AI පාලනය කරන්නේද යන්න නෙවෙයි, කිනම් පන්තිය විසින්ද යන්නයි.**

අගෝස්තු 2 සිට 7 දක්වා පැවැති සමාජවාදී සමානතා පක්ෂයේ (එජ) නවවන ජාතික සම්මේලනයේදී ඒකමතිකව සම්මත කරන ලද සහ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ සම්පූර්ණයෙන්ම ප්‍රකාශයට පත් කිරීමට නියමිත “AI සහ සමාජවාදය සඳහා වූ සටන” (“AI and the fight for socialism”) යෝජනාවෙන් මතු කලේ එම ප්‍රශ්නයයි.

**“AI හි සංවර්ධනය මගින් නිෂ්පාදන බලවේගවල සෑම මහා ඉදිරි පිම්මකදීම කම්කරු පන්තිය මුහුණ දෙන තීරණාත්මක ප්‍රශ්න මතු කරයි,” “මෙහි හිමිකරු කවුද? මෙය සංවර්ධනය කරන්නේ කාගේ වුවමනාවටද? මෙය යොදවන්නේ කුමන අරමුණකටද? දැන් එක්රැස් වී ඇති මෙම දැවැන්ත බලයන් මනුෂ්‍යත්වයේ විමුක්තියේ මාධ්‍යය වන්නේද නැතහොත් නව ම්ලේච්ඡත්වයක මාධ්‍යය වන්නේද යන්න රැඳී තිබෙන්නේ මෙම ප්‍රශ්න මතය” ලෙස යෝජනාව සඳහන් කරයි.**

මිනිස් පාලනයෙන් මිදෙන තර්ජනයක් ලෙස AI නිරූපණය කිරීමට එරෙහිව, යෝජනාව අවධාරණය කරන්නේ “මෙම ප්‍රතිගාමී භාවිතයන් කිසිවක් තාක්ෂණයෙන්ම පැන නගින්නේ නැති බවත්, ඒවා පැන නගින්නේ එය සංවර්ධනය වන සමාජ සබඳතා — එනම් පෞද්ගලික හිමිකාරිත්වය, ලාභ පද්ධතිය සහ ලෝකය ප්‍රතිවාදී ජාතික-රාජ්‍යයන් ලෙස බෙදී පැවතීම — තුළින් බවත්ය.” එය “අත්හිටුවීමේ” (pause) ඉල්ලීම ප්‍රතික්ෂේප කරයි — එය කෙබඳු ආකාරයකින් සකස් කළද, තාක්ෂණයේ සංවර්ධනයම නවත්වා දැමීමේ ආයාචනයකි.

යෝජනාව අවසන් කරන පරිදි: “කම්කරු පන්තිය තම ශ්‍රමයෙන් නිර්මාණය කරන ලද සියලුම නිෂ්පාදක බලවේගවල අයිතිය ලබා ගත යුතුවාක් මෙන්ම AI හි අයිතිය ද ලබා ගත යුතු අතර, ඒවා පැහැරගෙන ඇති කෝටිපති ප්‍රභූන්ගේ දේපළ අත්පත් කරගෙන ලෝක ආර්ථිකය සමාජවාදී පදනම් මත ප්‍රතිසංවිධානය කළ යුතුය.”

*මෙම ලිපිය ගැන ප්‍රශ්න තිබේද? Socialism AI ගෙන් අසන්න:*

*බර්නි සැන්ඩර්ස්ගේ සැබෑ දේශපාලන ඉතිහාසය කුමක්ද, සහ WSWS ඔහුව කම්කරු පන්ති විරෝධය පාලනය කිරීම සඳහා වූ ඩිමොක්‍රටික් පක්ෂයේ යාන්ත්‍රණයේ කොටසක් ලෙස සලකන්නේ ඇයි?*

*කෘතිම බුද්ධිය (AI) සහ නිෂ්පාදන බලවේග (productive forces) පෞද්ගලික හිමිකාරිත්වය යටතේ සංවර්ධනය වීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද, සහ තාක්ෂණය භාවිතා වන ආකාරය සඳහා එම රාමුව වැදගත් වන්නේ ඇයිද යන්න පැහැදිලි කළ හැකිද?*

*ධනවාදය යටතේ අතීතයේ සිදුවූ තාක්ෂණික සොයාගැනීම් — නිෂ්පාදනයේ ස්වයංක්‍රීයකරණය වැනි — දැවැන්ත රැකියා අහිමිවීම්වලට හේතු වූයේ කෙසේද, සහ එවිට රක්ෂා අහිමි වූ කම්කරුවන්ට සිදුවූයේ කුමක්ද?*

*සහ තවත් ප්‍රශ්න SocialismAI.com වෙතින් අසන්න.*

# ඇමරිකානු කම්කරුවෝ සහ තරුණයෝ සමාජවාදය දෙසට හැරෙමින් සිටිති

**පැට්‍රික් මාටින්** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* ජූලි *30* දින *"American workers and youth are turning towards socialism"* යන හිසින් පළවූ පැට්‍රික් මාටින් විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

පසුගිය දින කිහිපය තුළ ප්‍රකාශයට පත් කරන ලද අලුත් මත විමසුම් කිහිපයක්ම, ඇමරිකානු කම්කරුවන් සහ තරුණයින් අතර සිදුවෙමින් පවතින කැපී පෙනෙන වමට හැරීම පිළිබඳ ඉඟි සපයා ඇත. කොමියුනිස්ට්-විරෝධය මුළුමනින්ම පාහේ රාජ්‍ය ආගමක් බදු වන සහ සමාජවාදී මතවාදයන් සියවසකට ආසන්න කාලයක් තිස්සේ නිල දේශපාලනයෙන් බොහෝ දුරට බැහැර කර ඇති රටක, ලියාපදිංචි ඡන්දදායකයින්ගෙන් සියයට *40* කට ආසන්න ප්‍රමාණයක් ප්‍රකාශ කර ඇත්තේ ජනාධිපති ධුරය සඳහා සමාජවාදී අපේක්ෂකයෙකුට ඡන්දය දීම ගැන තමන් සලකා බලන බවයි.

බ්‍රහස්පතින්දා ප්‍රකාශයට පත් කරන ලද වොෂිංටන් පෝස්ට් - ඉප්සෝස් (Washington Post-Ipsos) මත විමසුමට අනුව, මෙම අගය වයස අවුරුදු 30 ට අඩු ඡන්දදායකයින් අතර සියයට 46 දක්වාත්, ඩිමොක්‍රටික් පක්ෂ ඡන්දදායකයින් අතර සියයට 64 දක්වාත් ඉහළ ගියේය.

සමාජවාදය සඳහා වන මෙම වේගවත් සහයෝගය වර්ධනය වීම තිබියදීත් — නැතහොත් එය නිසාම — මත විමසුම් ප්‍රතිඵලය මුලින් ප්‍රකාශයට පත් කරන ලද්දේ "බහුතරයක් ඇමරිකානුවන් ජනාධිපති ධුරය සඳහා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදියෙකුට සහය නොදක්වන බව පවසති" යන සිරස්තලය යටතේය. සිය ගණනින් බිලියනපති වන ජෙෆ් බෙසෝස් (Jeff Bezos) ට අයත් පුවත්පතක සේවය කරන වොෂිංටන් පෝස්ට් කර්තෘවරුන් තමන්ගේ වාසිය සැලසෙන්නේ කොතැනින්ද යන්න හොඳින් දනිති.

ඊටත් වඩා වැදගත් ලෙස, බ්‍රහස්පතින්දාම ප්‍රකාශයට පත් කරන ලද SSRS විසින් පවත්වන ලද CNN මත විමසුමකට අනුව, ඩිමොක්‍රටිකයන්ගෙන් සහ ඩිමොක්‍රටික්-ලැදි ස්වාධීන පුද්ගලයන්ගෙන් තුනෙන් එකක් පමණ තමන් "ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදීන්" (democratic socialists) ලෙස හඳුනා ගනිති. මොවුන්ගෙන් සියයට 59 ක් වයස අවුරුදු 45 ට අඩු අය වන අතර, එයට සාපේක්ෂව එය ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදීන් ලෙස හඳුනා නොගන්නා ඩිමොක්‍රටිකයින්ගේ සියයට 46කි. තුනෙන් දෙකක්ම ප්‍රකාශ කළේ තමන් 2026 අඩකාලීන මැතිවරණයේදී




*2026* මාර්තු *28* වන දින නිව්යෝර්ක් නගරයේ පැවති දැවැන්ත "රජුන් එපා" රැලියේ කොටසක්.

(midterm elections) ඡන්දය දීමට බොහෝ දුරට ඉඩ ඇති බවත්, ඔවුන්ගෙන් සියයට 99 ක්ම ඩිමොක්‍රටිකයින්ට ඡන්දය දෙන බවත්ය.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදීන් ලෙස හඳුනා නොගන්නා ඩිමොක්‍රටිකයින් හා සැසඳීමේදී, තමන් ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදීන් ලෙස හඳුනා ගන්නා අය "උපාධියක් ලබා තිබීමට ඇති ඉඩකඩ අඩු බවත් ( 66% සිට 54%) වසරකට ඩොලර් 100,000 ට වඩා අඩුවෙන් උපයා ගැනීමට ඇති ඉඩකඩ වැඩි බවත් ( 76% සිට 65%)" CNN මත විමසුමෙන් හෙළි විය. සුදු ජාතික ඡන්දදායකයින්ට වඩා කළු ජාතික ඡන්දදායකයින් ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදියෙකුට සහය දීමට වැඩි නැඹුරුවක් දැක්වූහ.

සමාජවාදය සඳහා වන සහයෝගය ආර්ථික තත්ත්වයට නොව ජීවන රටාවට අදාළ සුදු ජාතික ඉහළ-මධ්‍යම පංතික (upper-middle class) හැඟීමක් යැයි මාධ්‍ය තුළ අඛණ්ඩව කරනු ලබන ප්‍රකාශය මෙයින් බොරු කෙරේ. සමාජවාදය සඳහා වන සහයෝගය ධාවනය වනු ලබන්නේ, ධනවාදය තමන්ට පිරිනමන්නේ යුද්ධය, දරිද්‍රතාවය සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට එල්ල වන ප්‍රහාරයන්ගෙන් සමන්විත අඳුරු අනාගතයක් පමණක් බව පැහැදිලිවම වටහා ගැනීමට පටන් ගෙන සිටින කම්කරු පන්තියේ නව පරම්පරාවේ අත්දැකීම් විසිනි.

**මෙය මාක්ස්වාදයේ මූලික නියමයක් සනාථ කිරීමකි: එනම්, සාමාජික පැවැත්ම විසින් සාමාජික විඥ්ඥාණය (social consciousness) තීරණය කරන බවයි.** සමාජවාදී සමානතා පක්ෂය මෙම වර්ධනය නිවැරදිවම අපේක්ෂා කළේය. එහි 2010 වැඩසටහන ප්‍රකාශ කළේ "වාස්තවික (සැබෑ ලෝක) තත්වයන්ගේ වෙනස්වීම" — එනම් ඇමරිකානු සහ ලෝක ධනවාදයේ ගැඹුරු වන අර්බුදය — "ඇමරිකානු කම්කරුවන් [සමාජවාදය පිළිබඳ] ඔවුන්ගේ අදහස් වෙනස් කිරීමට හේතු වනු ඇති" බවයි. එකල විද්‍යාත්මක ප්‍රක්ෂේපණයක් (scientific projection) වූ දෙය දැන් පුළුල් සංසිද්ධියක් බවට පත්ව ඇත.

මත විමසුම් දෙකෙන්ම පෙන්නුම් කරන්නේ සමාජවාදයට ඇති සහයෝගය සහ ට්‍රම්ප්ගේ ඉරානයට එරෙහි යුද්ධයටත්, ඇමරිකාවේ අනුග්‍රහය ලබන ගාසා හි ඊශ්‍රායල ජන සංහාරයටත් (genocide) ඇති විරෝධය අතර දැඩි සබඳතාවයක් පවතින බවයි. ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදීන්ගෙන් අඩකට ආසන්න ප්‍රමාණයක්, එනම් සියයට 48 ක් ප්‍රකාශ කළේ ඊශ්‍රායලයට ඇමරිකාව දක්වන සහය කැපීමට සහය දෙන අපේක්ෂකයෙකු කෙරෙහි තමන් උද්‍යෝගිමත් වන බවයි.

තමන් ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදීන් ලෙස හඳුනා ගන්නා අය ඉරානයට එරෙහි යුද්ධයට අතිමහත් ලෙස විරුද්ධ වන අතර, එය සමස්තයක් ලෙස ඇමරිකානු මහජනතාව ද දරන මතයකි. ක්විනිපියැක් විද්‍යාලය (Quinnipiac College) විසින් පවත්වන ලදුව බදාදා ප්‍රකාශයට පත් කරන ලද වෙනම මත විමසුමකින් හෙළි වූයේ සියයට 66 ක් ට්‍රම්ප් යුද්ධය මෙහෙයවන ආකාරයට විරුද්ධ වූ අතර සියයට 60 ක් යුද්ධයටම විරුද්ධ වූ බවයි. පෙබරවාරි 28 වන දින ට්‍රම්ප් ආක්‍රමණශීලී යුද්ධය ආරම්භ කළ තැන් සිට මෙම සංඛ්‍යා දෙකම වාර්තා වූ ඉහළම අගයන් විය.

පසුගිය මාසයේ නිව් යෝර්ක් සහ කොලරාඩෝ හි පැවැති ඩිමොක්‍රටික් ප්‍රාථමික මැතිවරණවල (primaries) ප්‍රතිඵල — එනම් ඇමරිකාවේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදීන් (Democratic Socialists of America – DSA) සමඟ සම්බන්ධ වූ හෝ ඔවුන්ගේ සහය ලැබූ අපේක්ෂකයින් කොංග්‍රස් දිස්ත්‍රික්ක හතරක නාම යෝජනා දිනා ගනිමින්, දීර්ඝ කාලයක් සේවය කළ ඩිමොක්‍රටික් මන්ත්‍රීවරුන් තිදෙනෙකු පරාජයට පත් කිරීම — අසාමාන්‍ය සිදුවීමක් (aberration) නොවන බව මෙම මත විමසුම් මගින් තහවුරු වේ.

කාර්මික මිඩ්වෙස්ට් (Midwest) කලාපයේ පැවැත්වෙන ප්‍රධාන ප්‍රාථමික මැතිවරණ මගින් ඉදිරි සති දෙක තුළ මෙම වමට හැරීමට තවදුරටත් ප්‍රකාශනයක් ලබා දෙනදෙනු හැකිය. මිචිගන්හි, අගෝස්තු 4 වන දින සෙනෙට් සභාව සඳහා වන ඩිමොක්‍රටික් නාමයෝජනා තරඟයේදී හිටපු මහජන සෞඛ්‍ය නිලධාරී අබ්දුල් එල්-සයීඩ් (Abdul El-Sayed) මත විමසුම්වලදී නියෝජිත හැලී ස්ටීවන්ස් (Haley Stevens) සමඟ සම තත්ත්වයේ පසුවේ. එල්-සයීඩ්ට බර්නි සැන්ඩර්ස් (Bernie Sanders) සහ ඇලෙක්සැන්ඩ්‍රියා ඔකාසියෝ-කෝටෙස්ගේ (Alexandria Ocasio-Cortez) සහය හිමිව ඇති අතර, ස්ටීවන්ස්ට ඩිමොක්‍රටික් පක්ෂ සංස්ථාපිතයේ, ආණ්ඩුකාර ග්‍රෙචන් විට්මර්ගේ (Gretchen Whitmer) සහ ඊශ්‍රායල-ගැති කක්ෂයේ (pro-Israel lobby) සහය හිමිව ඇත.

ආණ්ඩුකාර ධුරය සඳහා වන ඩිමොක්‍රටික් නාමයෝජනා සඳහා විස්කොන්සින් හි පැවැත්වෙන ප්‍රාථමික තරඟයේදී, DSA සාමාජිකාවක සහ ප්‍රාන්ත නියෝජිතවරියක වන ෆ්‍රැන්චෙස්කා හොං (Francesca Hong), පක්ෂ සංස්ථාපිතයේ බෙහෙවින් වැඩි සහයක් ඇති වඩාත් ප්‍රසිද්ධ අපේක්ෂකයින් දෙදෙනෙකු වන මිල්වෝකි (Milwaukee) නගරාධිපති ඩේවිඩ් ක්‍රවුලි (David Crowley) සහ හිටපු නියෝජ්‍ය ආණ්ඩුකාර මැන්ඩෙලා බාර්න්ස් (Mandela Barnes) ට එරෙහිව මත විමසුම්වල සැලකිය යුතු පරතරයකින් ඉදිරියෙන් සිටී. එම ඡන්ද විමසීම අගෝස්තු 11 වන දින පැවැත්වේ.

ධනපති පක්ෂ දෙකම, එනම් රිපබ්ලිකානුවන් තරම්ම ඩිමොක්‍රටිකයන් ද ඡන්දදායකයින්ගෙන් බහුතරයකගේ පිළිකුලට ලක්ව ඇති තත්ත්වයන් යටතේ සමාජවාදය සඳහා වන සහයෝගය වර්ධනය වීම කැපී පෙනෙන කරුණකි. වෙනසෙහි (change) පක්ෂය කුමක්ද, ඔවුන් වැනි ජනතාව ගැන සැලකිලිමත් වූයේ කුමන පක්ෂයද, දූෂණයට එරෙහිව සටන් කළේ කුමන පක්ෂයද සහ වැඩක් කර දුන්නේ කුමන පක්ෂයද යන්න CNN විසින් විමසූ විට, ඒ කිසිදු පක්ෂයකට සහය දැක්වූවාට වඩා වැඩි ඡන්දදායකයින් සංඛ්‍යාවක් සෑම

ප්‍රශ්නයකටම පිළිතුරු දුන්නේ “දෙකෙන් එකක්වත් නැත” යනුවෙනි. නොවැම්බර් මාසයේදී කොංග්‍රස් මණ්ඩලයේ බොහෝ මන්ත්‍රීවරුන් නෙරපා හැරිය යුතු බව බහුතරයක් CNN වෙත පැවසූහ.

පසුගිය සති අන්තයේ පවත්වන ලද රොයිටර්/ඉප්සෝස් (Reuters/Ipsos) මත විමසුමකින් හෙළි වූයේ, ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී අදහස් සඳහා සහ MAGA (“Make America Great Again”- ඩොනල් ට්‍රම්ප් විසින් නායකත්වය දෙන දක්ෂිණාංශික පොපුලිස්ට් ෆැසිස්ට්වාදී දේශපාලන ව්‍යාපාරය) රිපබ්ලිකානුවන්ගේ අදහස් සඳහා එකම මට්ටමේ සහයෝගයක් පවතින බවයි, එනම් එකිනෙකට සියයට 27 බැගිනි. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් අඩකටත් වඩා අඩු පිරිසක් තමන් ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ප්‍රතිපත්ති තේරුම් ගත් බව පවසද්දී සහ MAGA ප්‍රතිපත්ති සඳහා සංගත මාධ්‍ය, රිපබ්ලිකන් පක්ෂය සහ ට්‍රම්ප් පරිපාලනය මගින් නොකඩවා ප්‍රචාරණය ලබා දෙන බව සලකා බලන විට මෙය කැපී පෙනෙන සංඛ්‍යාවකි.

මාධ්‍ය ප්‍රචාරණය, ප්‍රශ්න සකස් කර ඇති ආකාරය සහ ප්‍රතිචාර දක්වන්නන් තෝරා ගන්නා ආකාරය සහ ඔවුන්ගේ අදහස් ජනගහන විද්‍යාත්මකව “බර තබන” (weighted) ආකාරය නිසා බලපෑමට ලක්වන මත විමසුම් මගින් මහජන හැඟීම් පිළිබඳ විකෘති ප්‍රකාශනයක් පමණක් ලබා දෙන බව පැවසිය යුතුය. තවද, සමාජයේ පැවැත්මට ඇති එකම ආර්ථික පදනම ධනවාදය ලෙස ඉදිරිපත් කරන, සංගත පාලනය යටතේ පවතින ද්වි-පක්ෂ ක්‍රමය තුළ ඒවා පවත්වනු ලැබේ.

තිව්‍ර වන යුද්ධය, ආර්ථික කැළඹුම (economic dislocation) සහ ඒකාධිපතිවාදය දෙසට වන ධාවනය හමුවේ මිලියන සංඛ්‍යාත කම්කරුවන්ගේ මූලික වමට හැරීම, DSA හි මැතිවරණ ජයග්‍රහණ ලෙස මූලික ස්වරූපය ගෙන ඇත. නමුත් DSA යනු කම්කරු පන්තිය තුළ වර්ධනය වන ව්‍යාපාරයේ වාහකය නොවේ. එය ඊට බාධාවකි — එනම් එය වෝල් වීදියේ (Wall Street) සහ හමුදාවේ පක්ෂ දෙකෙන් එකක් වන ඩිමොක්‍රටික් පක්ෂයේ කණ්ඩායමක් (faction) වන අතර, එහි කාර්යය වන්නේ කම්කරුවන්ගේ සහ තරුණයින්ගේ වර්ධනය වන විරෝධය නැවත ධනපති දේශපාලනයේ රාමුව තුළට යොමු කිරීමයි.

කෙසේ වෙතත්, මෙම රැඩිකලීකරණයේ අත්‍යවශ්‍ය අන්තර්ගතය ප්‍රතිසංස්කරණවාදී (reformist) නොවන අතර, එය එම රාමුව තුළ සීමා නොවෙනු ඇත. කම්කරුවන් සහ තරුණයින් ධනවාදයට එරෙහිව හරවන එම අර්බුදයම ඔවුන්ව ඩිමොක්‍රටික් පක්ෂය සමඟ ගැටුමකට ගෙන එනු ඇත. 2025 ජනවාරි 4 වන දින WSWS හි අලුත් අවුරුදු ප්‍රකාශනයේ සඳහන් කර ඇති පරිදි: “පසුගිය වසර පහ තුළ ධනපති අර්බුදයට පාලක පන්තියේ ප්‍රතිචාරය ආධිපත්‍යය හෙබවීය. ඉදිරි වසර පහ තුළ පංති අරගලයේ පිපිරුම්කාරී නැගිටීම ආධිපත්‍යය දරනු ඇත; එය දැනටමත් සිදුවෙමින් පවතී.”

මෙම මත විමසුම්වල වාර්තා වී ඇති සමාජවාදය සඳහා වන සහයෝගයේ වර්ධනය අති මූලික දේශපාලන ගැටලුව විසඳන්නේ නැත, ඊට විපරීතව එය වඩාත් තියුණු ලෙස මතු කරයි. මහජන හැඟීම් තවමත් සවිඥානක දේශපාලන ව්‍යාපාරයක් නොවේ. අවශ්‍ය වන්නේ සමාජවාදය යනු කුමක්ද සහ එය සාක්ෂාත් කරගත හැක්කේ කෙසේද යන්න පැහැදිලි කිරීමට සමත් විප්ලවවාදී නායකත්වයක් කම්කරු පන්තිය තුළ ගොඩනැගීමයි.

කම්කරුවන් සහ තරුණයින් 20 වන සියවසේ මූලික ඓතිහාසික කරුණු, සියල්ලටමත් වඩා ලියොන් ට්‍රොට්ස්කි විසින් ස්ටාලින්වාදයට එරෙහිව ගෙන ගිය අරගලය සීරුවෙන් පරීක්ෂා කළ යුතුය. අද කම්කරුවන් සහ තරුණයින් ට්‍රොට්ස්කිගේ මෙම අවවාදය සිහි තබා ගත යුතුය, **“තරුණයිනි, දේශපාලනය හදාරන්න!”**

සමාජවාදය සාක්ෂාත් කරගත හැක්කේ සහ සාක්ෂාත් කරගනු ඇත්තේ ඇමරිකා එක්සත් ජනපදයේ සහ සමස්ත ලෝකය පුරාම ධනපති ක්‍රමයට එරෙහි අරගලයේදී කම්කරු පන්තිය ස්වාධීන දේශපාලන බලමුලු ගැන්වීමක් මගින් පමණි.

මෙයට සැබෑ සමාජවාදී වැඩසටහනක් අවශ්‍ය වේ: එනම්, පාලක පන්තියේ පක්ෂ දෙකෙන්ම කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය; මූල්‍ය කතිපයාධිකාරය අස්වාමික කිරීම(දේපළ අත්පත් කර ගැනීම) සහ බැංකු හා විශාල සමාගම් ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතේ පවතින මහජන සේවාවන් බවට පරිවර්තනය කිරීම; පෞද්ගලික ලාභයට වඩා මිනිස් අවශ්‍යතා සපුරාලීම සඳහා ආර්ථික ජීවිතය ප්‍රතිසංවිධානය කිරීම. මෙම මත විමසුම් මගින් ආරම්භයක් සනිටුහන් කරයි. අති මූලික ප්‍රශ්නය වන්නේ එහි සවිඥානික දේශපාලන දිශානතියයි — එනම් ඇමරිකා එක්සත් ජනපදයේ සහ ජාත්‍යන්තරව කම්කරු පන්තිය තුළ විප්ලවවාදී නායකත්වයක් ගොඩනැගීමයි.

මෙයින් අදහස් කරන්නේ ඇමරිකා එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂය සහ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (International Committee of the Fourth International) ගොඩනැගීමයි. අප හා එක්වන ලෙස අපි කම්කරුවන්ගෙන් සහ තරුණයින්ගෙන් ඉල්ලා සිටිමු.

[අවධාරණය පරිවර්තනයේදී එකතු කෙරුණි]



# CIMP පනත් කෙටුම්පත පිළිබඳ FMM සංවාදයට අප මැදිහත් වන්නේ ඇයි? මාධ්‍ය නිදහස සඳහා වූ ස්වාධීන පන්ති වැඩපිළිවෙළක්

**සංජය ජයසේකර** විසිනි.

මෙම ලිපිය ඉංග්‍රීසි බසින් ‘*CIMP Bill: Why We are Intervening in the FMM Forum — An Independent Class Line for Press Freedom*’ යන සිරසින් 2026 අගෝස්තු 13 දින theSocialist.lk හි පළ කෙරුණි.

2026 අගෝස්තු 14 වන සිකුරාදා, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේදී “යෝජිත මාධ්‍ය වෘත්තිකයන්ගේ වරලත් ආයතනය, භාෂණයේ නිදහස සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියේ අනාගතය” මැයෙන් සම්මේලනයක් පවත්වනු ලබයි. මෙම සංවාදය සඳහා මානව හිමිකම් නීතිඥ ලක්ෂාන් ඩයස් හා දක්ෂිණාංශික දේශපාලන මූලෝපායඥයකු වන ශිරාල් ලක්තිලක සහභාගී වන අතර, ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වයේ (Socialist Lead of Sri Lanka and South Asia – SLLA) හා හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (International Committee of the Fourth International – ICFI) ට්‍රොට්ස්කිවාදී ඉදිරිදර්ශනය නියෝජනය කරමින් මම සහභාගී වෙමි.

විප්ලවවාදී සමාජවාදී-ජාත්‍යන්තරවාදී ව්‍යාපාරයේ නියෝජිතයෙකු, ධනපති සංස්ථාපිතයේ දක්ෂිණාංශික දේශපාලන මූලෝපායඥයකු සහ ලිබරල් රාජ්‍ය නොවන සංවිධාන (NGO) නැඹුරුවක් සහිත මානව හිමිකම් නීතිඥයෙකු සමඟ මෙසේ එකම වේදිකාවක් බෙදා ගන්නේ මන්දැයි මාධ්‍යවේදීන්, කම්කරුවන් සහ තරුණයන් තුළ ප්‍රශ්න මතු විය හැක. මෙයින් අදහස් වන්නේ ඔවුන්ගේ දේශපාලනය සමඟ සම්මුතියක් හෝ FMM හි




ප්‍රතිසංස්කරණවාදී (reformist) රාමුවට යටත් වීමක් නොවේද?

ඊට පිළිතුර එකහෙළාම ‘නැත’ යන්නයි. අප මෙම සංවාදයට මැදිහත් වන්නේම කිසිදු යටත් වීමකින් තොරව දේශපාලන සටනක් දියත් කිරීම සඳහා ය: එනම්, මාධ්‍ය කම්කරුවන් හමුවේ අටවා ඇති ධනපති සහ සුළු-ධනපති උගුල් හෙළිදරව් කිරීමටත්, විප්ලවවාදී මාක්ස්වාදය සහ ලිබරල් ප්‍රතිසංස්කරණවාදයේ (liberal reformism) හා ධනපති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදයේ (bourgeois constitutionalism) බංකොලොත් දේශපාලනය අතර පැහැදිලිම බෙදුම්කඩන රේඛාව ඇඳීමටත්, ජාතික ජන බලවේගය / ජේවීපී ආණ්ඩුවේ මාධ්‍ය වෘත්තිකයන්ගේ වරලත් ආයතනය (Chartered Institute of Media Professionals – CIMP) පනත් කෙටුම්පත පරාජය කිරීම සඳහා වූ ස්වාධීන, විප්ලවවාදී මූලෝපායක් කම්කරු පන්තිය හමුවේ තැබීමටත් ය.

අප මෙම වේදිකාවටගොඩවන්නේ ලක්තිලක සහ ඩයස් සමඟ සම්මුතියක් ඇති කර ගැනීමට නොව, මාධ්‍යවේදීන්, මාධ්‍ය කම්කරුවන්, තරුණයන් සහ බුද්ධිමතුන්ගෙන් සමන්විත සභාවක් ඉදිරියේ ඔවුන් නියෝජනය කරන මතවාද දේශපාලනිකව සුනුවිසුනු කිරීමටත් — එම ප්‍රේක්ෂකයන් හතරවන ජාත්‍යන්තරයේ ස්වාධීන පන්ති වැඩපිළිවෙළ වෙත දිනා ගැනීමටත් ය.

**මූලධර්මය: විප්ලවවාදීන් ධනපති වේදිකාවල මැදිහත්වීම් කරන්නේ ඇයි?**

විප්ලවවාදීන් පන්ති සතුරන් සමඟ එකම වේදිකාවක් බෙදා නොගත යුතුය — එසේ කිරීමෙන් දේශපාලන අනුමැතියක් හෝ පාවාදීමක් අඟවන්නේ යැයි කියන — යන විරෝධතාව අලුත් එකක් නොවේ. එය, 1920 දී ලෙනින් විසින් රචිත ‘“වාමාංශික” කොමියුනිස්ට්වාදය: ළදරු වලිප්පුවක් (“Left-Wing” Communism: an Infantile Disorder)’ නැමැති පොතෙන් සුනුවිසුනු කර දැමූ “වාමාංශික” ළදරු ආබාධයේම තවත්

එක් ප්‍රභේදයකි. එහිදී, කම්කරු පන්තිය, ධනපති සහ සුළු-ධනපති ප්‍රවණතාවල අනතියෝගී මතවාදී බලපෑමට යටත් කරන කට්ටිවාදී අක්‍රියතාවයක් (sectarian passivity) ලෙස අති-වාමාංශික වර්ජකවාදය (ultra-left abstentionism) ලෙනින් විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

වර්ජකවාදය (Abstentionism) තමන්ව ඉදිරිපත් කර ගන්නේ පිරිසිදු විප්ලවවාදී භාවයක් ලෙසයි. 'පංති සතුරන් සමඟ එකම වේදිකාවක් බෙදා ගනිමින් අපව කිලුටු කර ගන්නේ නැහැ.' 'සමාජ-ස්වෝත්තමවාදීන් (Social-chauvinists) විසින් මෙහෙයවනු ලබන ප්‍රතිගාමී වෘත්තීය සමිතිවලට අපි ඇතුළු වන්නේ නැහැ.' 'අපි ධනපති පාර්ලිමේන්තු වලට සහභාගි වන්නේ නැහැ.' මෙම ස්ථාවරය රැඩිකල් එකක් ලෙස පෙනී යයි. දේශපාලනික වශයෙන් පිරිසිදුව සිටීමේ ආත්මීය අවශ්‍යතාව එයින් තෘප්තිමත් කෙරේ. නමුත් මෙහි වාස්තවික ඵලය වන්නේ විප්ලවවාදී බවේ ප්‍රතිපක්ෂය යි: එනම්, සටන් බිම හැර යාමයි. එය වෘත්තීය සමිති සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණවාදී නිලධාරීන්ගේ (Reformist bureaucrats) අතට අතහැර දමයි. පාර්ලිමේන්තුව ධනපති පක්ෂවලට බාර කරයි. එකදු ප්‍රතිවිරුද්ධ හඬක් හෝ නොමැතිව, FMM සංවාදය ලක්ෂාන් ඩයස් සහ ශිරාල් ලක්තිලක වෙත — එනම් ලිබරල් නීතිවාදයට (Liberal legalism) සහ ධනපති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදයට (Bourgeois constitutionalism) — යටත් කර දමයි. එවිට, මෙම සංවාදයට සහභාගි වන කම්කරුවන්ට, මාධ්‍යවේදීන්ට සහ තරුණයන්ට ඇසීමට ලැබෙන්නේ එක පැත්තක හඬ පමණි: එනම් රාජ්‍යයට පෙත්සම් ගසන ලෙස, අධිකරණය කෙරෙහි විශ්වාසය තබන ලෙස සහ තමන්ගේ අයිතිවාසිකම් සුරාකන පද්ධතියේම රාමුව තුළ පිළියම් පතන ලෙස ඔවුන්ට පවසන පාර්ශ්වයේ හඬ පමණි.

එය විප්ලවවාදී සුපිරිසිදු බවක් නොවේ. එය දේශපාලනික බිම අතහැර පලායාමයි. (Political desertion). පීඩිත ජනතාව විකල්පයක් සොයමින් සිටින තීරණාත්මක මොහොතේම, ඔවුන්ව පංති සතුරාගේ මතවාදී ආධිපත්‍යයට (Ideological hegemony) බාරදී අතහැර දැමීමයි.

ජර්මානු "වාම" කොමියුනිස්ට්වාදීන් තර්ක කළේ, සමාජ-ස්වෝත්තමවාදීන් (social-chauvinist) සහ ප්‍රති-විප්ලවවාදී (counter-revolutionary) නායකයන්ගේ ග්‍රහණයට හසුව තිබූ බැවින් විප්ලවවාදීන් ප්‍රතිගාමී වෘත්තීය සමිති තුළ වැඩ කිරීම ප්‍රතික්ෂේප කළ යුතු බවයි. පාර්ලිමේන්තුවාදය "ඓතිහාසිකව සහ දේශපාලනිකව යල් පැන ගිය එකක්" වූ බැවින් විප්ලවවාදීන් ධනපති පාර්ලිමේන්තුවලට සහභාගී වීම ප්‍රතික්ෂේප කළ යුතු බවට ද ඔවුහු තර්ක කළහ. ඊට ලෙනින් දුන් පිළිතුර ප්‍රබල එකක් විය:

"ඔබට 'මහජනතාවට' උදව් කරන්නත්, 'මහජනතාවගේ' සහකම්පනය සහ සහයෝගය දිනාගන්නත් ඕන නම්, ඔබ 'නායකයන්ගෙන්' සුදු වෙන කරදර, රැවටීම් හා වංචාවන්, අපහාස, හිංසනයන්ට බය වෙන්න හොඳ නැහැ ... **මහජනතාව ඉන්නෙ කොතැනද ඔබ එතැන අනිවාර්යයෙන්ම වැඩ කරන්න ඕන.** නිර්ධන පන්තික හෝ අර්ධ-නිර්ධන පන්තික මහජනතාව ඉන්න ඒ ආයතන, සමිති සහ සංගම්වල — ඒවා කොච්චර ප්‍රතිගාමී ඒවා වුණත් — ක්‍රමවත්ව, නොපසුබටව, කැපවීමෙන් සහ ඉවසීමෙන් උද්ඝෝෂණ හා ප්‍රචාරක කටයුතු කරගෙන යන්න ඕනෑම කැප කිරීමක් කරන්න, ලොකුම බාධක පවා ජය ගන්න ඔයාලට පුළුවන් වෙන්න ඕන."

මූලික මූලධර්මය වන්නේ මෙයයි. විප්ලවවාදී පක්ෂය තමන්ගේ අරගල භූමිය තෝරා ගන්නේ තමන්ගේ පහසුව තකා නොවේ. එය මහජනතාව සිටින තැනට යයි — නැතහොත්, මෙම අවස්ථාවේ දී නම්, මාධ්‍ය නිදහස පිළිබඳ ප්‍රශ්නයට පිළිතුරු සොයන මාධ්‍යවේදීන්, මාධ්‍ය කම්කරුවන්, අන්තර්ගත නිර්මාණකරුවන් (content creators) සහ දේශපාලනිකව සවිඥානික තරුණයන් රැස්වන ස්ථානයට ය. FMM සංවාදය, එහි දේශපාලන සීමාවන් කෙබඳු වුවත්, හරියටම මෙකී පිරිස ආකර්ෂණය කර ගනු ඇත. ඊට සහභාගී වීම ප්‍රතික්ෂේප කිරීම, වේදිකාව සම්පූර්ණයෙන්ම ලක්ෂාන් ඩයස්ට සහ ශිරාල් ලක්තිලකට අතහැර දැමීම යනු, එම පිරිස ධනපති සහ සුළු-ධනපති දේශපාලනයේ බලපෑමට බිලිදීමයි. **එය විප්ලවවාදී පිරිසිදුකම නොව දේශපාලන බියගුලුකමකි.**

සිවිල් සමාජ සම්මේලනයකටත් වඩා තමන්ගේ කාර්යභාරය පැත්තෙන් ප්‍රතිගාමී වූ ආයතන වන ධනපති පාර්ලිමේන්තුවලට සහභාගී වීමේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ලෙනින් වඩාත් පැහැදිලි විය:

"කාර්මික කම්කරුවන්ගෙන් තරමක් විශාල සුළුතරයක්.... කතෝලික පූජකයන්ගේ නායකත්වය පස්සේ යනවා නම්... ඒකෙන් පැහැදිලිවම අදහස් වෙන්නේ ජර්මනියේ පාර්ලිමේන්තුවාදය තාමත් දේශපාලනිකව යල් පැන ගිහින් නැහැ කියන එකත්, ඒ වගේම, තමන්ගේම පන්තියේ පසුගාමී කොටස් අධ්‍යාපන ගත කිරීමේ අරමුණෙන්ම, පාර්ලිමේන්තු මැතිවරණවලට සහ පාර්ලිමේන්තු වේදිකාවේ අරගලයට සහභාගී වීම විප්ලවවාදී නිර්ධන පන්තියේ පක්ෂයට අනිවාර්ය දෙයක් වෙන බවත්."

එම තර්කයම මෙහිදී අදාල වේ. FMM සම්මේලනයට සහභාගී වන මාධ්‍යවේදීන් සහ මාධ්‍ය කම්කරුවන් තවමත් විප්ලවවාදී ඉදිරිදර්ශනය වෙත දිනාගෙන නොමැත. බොහෝ දෙනෙක් ඩයස්ගේ ලිබරල්-නීතිවාදී (liberal-legalist) තර්කවලට හෝ ලක්තිලකගේ ධනපති-ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදී (bourgeois-constitutionalist) ගණන් බැලීම් වලට ආකර්ෂණය වී සිටින බව නොඅනුමානය. **ට්‍රොට්ස්කිවාදියාගේ කාර්යභාරය වන්නේ එම වේදිකාවේ පෙනී සිටීමත්, මාක්ස්වාදී විකල්පය ඉදිරිපත් කිරීමත්, එම මැදිහත්වීම තුළින් වඩාත්ම ප්‍රගතිගාමී කොටස් දැනුවත් කිරීම, හෙළිදරව් කිරීම සහ ස්වාධීන පන්ති වැඩපිළිවෙළ වෙත දිනා ගැනීමත් ය.**

බෝල්ෂෙවික්වරු (Bolsheviks) විසින්ම මීට ඓතිහාසික ආදර්ශය

සපයා ඇත. 1905 දී, ඔවුහු බුලිගින් ඩූමාව (Bulygin Duma) — නැමැති උපදේශක "පාර්ලිමේන්තුව" — නිවැරදිවම වර්ජනය කළහ. මන්දයත්, වාස්තවික තත්ත්වය ජන අරගල සහ සන්නද්ධ නැගිටීම් දෙසට වේගයෙන් වර්ධනය වෙමින් පැවති බැවිනි. නමුත් 1906 දී, විප්ලවවාදී රැල්ල බැස ගිය විට, ඩූමාව වර්ජනය කිරීම වරදක් වූ අතර බෝල්ෂෙවික්වරු එය නිවැරදි කර ගත්හ. ඔවුහු වඩාත්ම ප්‍රතිගාමී පාර්ලිමේන්තුවට පවා සහභාගී වූ අතර, එහි වේදිකාව විප්ලවවාදී උද්ඝෝෂණය සඳහා භාවිතා කරමින්, එම කාර්යය හරහා ජනතාව සමඟ පක්ෂයේ සබඳතාව ගොඩනැගූහ. ලෙනින් එම පාඩම මෙසේ සංක්ෂිප්ත කළේය:

"1905 දී බෝල්ෂෙවික්වරු 'පාර්ලිමේන්තුව' වර්ජනය කිරීම විප්ලවවාදී නිර්ධන පන්තියට හරිම වටිනා දේශපාලන අත්දැකීමක් එකතු කළා... හැබැයි, ඒ අත්දැකීම වෙනස් තත්ත්වයන්ට සහ වෙනස් අවස්ථාවලට අන්ධ ලෙස, අනුකරණය කරමින්, විවේචනයකින් තොරව ආදේශ කරන්න යෑම අතිශයින්ම වැරදියි."

අද, ශ්‍රී ලංකාවේ පවත්නා තත්ත්වය, කම්කරු පංතිය සෝවියට් සභා ගොඩනගමින් බලය පිළිබඳ ප්‍රශ්නය වහාම මතු කෙරෙන මහජන විප්ලවවාදී නැගී සිටීමේ තත්ත්වයක් නොවේ. එය, සමාජ අර්බුදය උග්‍රවන, සමාජ කප්පාදු (austerity) ගැඹුරු කරන, සහ අධිපතිවාදී රාජ්‍ය යන්ත්‍රණයක් ගොඩනැගෙමින් පවතින කාලපරිච්ඡේදයකි — මෙහිදී මාධ්‍යවේදීන්, අන්තර්ගත නිර්මාණකරුවන් සහ තරුණයන්ගේ පුළුල් ස්තරයන් දේශපාලන මගපෙන්වීමක් සොයමින් සිටියි. මෙවැනි තත්ත්වයක් තුළ, ලිබරල් රාජ්‍ය නොවන සංවිධානයක් (NGO) විසින් සංවිධානය කරනු ලබන සහ ධනපති කථිකයන් සහභාගී වන එකක් වූ පලියට මාධ්‍ය නිදහස පිළිබඳ ප්‍රසිද්ධ සංවාදයක් වර්ජනය කිරීම යනු, අප දිනා ගැනීමට උත්සාහ කරන ස්තරයන්ටම පිටුපෑමකි. **නිවැරදි උපක්‍රමය වන්නේ මැදිහත් වීම, මායිම් රේඛා සටහන් කිරීම සහ සටන් කිරීමයි.**

**යටත්වීමක් නැත: තියුණු මතභේදමිකඩනය ඇඳීම**

මැදිහත් වීම යනු සම්මුතියක් නොවේ. මෙම වෙනස මූලික එකක් වන අතර, මේ පිළිබඳ පටලවා ගැනීම මාරාන්තික වේ.

ලෙනින්වාදී අර්ථයෙන් සම්මුතියක් යනු වැඩපිළිවෙළ හෝ ප්‍රතිපත්තියේ යටත් වීමක් අඩංගු වන්නකි — එනම් කම්කරු පන්තියේ ස්වාධීන වුවමනාවන්, ධනපති පංතියේ හෝ සුළු-ධනපති පංතියේ වුවමනාවන්ට යටත් කිරීමට එකඟ වීමයි. මහජන පෙරමුණ (Popular Front) — එනම් කොමියුනිස්ට් පක්ෂය, ධනපති පංතිය මෙහෙයවන සන්ධානයකට යටත් කිරීම — එවැනි සම්මුතියක් විය. වෘත්තීය සමිති නිලධාරි තන්ත්‍රය, දිසානායක ආණ්ඩුව සමඟ ඇති කර ගෙන ඇති "වැඩ වර්ජන නොකිරීමේ" ගනුදෙනු එවැනි සම්මුතියකි. විශ්‍රාම වැටුප් සහ බැංකු ණය වෙනුවෙන් CIMP පනත් කෙටුම්පත සාදරයෙන් පිළිගන්නා ආයතනගත මාධ්‍යවේදීන් එළඹෙන්නේ ද එවැනි සම්මුතියකටයි.

FMM සම්මේලනයට අප සහභාගී වීම තුළ එවැනි කිසිවක් අඩංගු නොවේ. අප අපගේ එකදු ස්ථාවරයක්වත් වෙනස් කර නොමැත. අපගේ එකදු විවේචනයක්වත් නිහඬ කර නැත. ලක්තිලක, ඩයස් හෝ FMM සමඟ කිසිදු පොදු වේදිකාවකට, ඒකාබද්ධ ප්‍රකාශනයකට හෝ එක්සත් ඉල්ලීමකට අප එකඟ වී නොමැත. ඊට පටහැනිව, අප ඔවුන්ගේ වේදිකාවට ගොඩවන්නේම ඔවුන්ගේ දේශපාලනයේ බංකොලොත්භාවය හෙළිදරව් කිරීමේ සහ විප්ලවවාදී විකල්පය ඉදිරිපත් කිරීමේ පැහැදිලි අරමුණෙනි. අප ඔවුන්ගේ හවුල්කරුවන් නොවේ. අප ඔවුන්ගේ දේශපාලන පසමිතුරන් වන අතර, එම සභාවේ සිටින සෑම අයෙකුටම එම සත්‍යය පැහැදිලිවම තේරුම් කර දීමට අප මෙම අවස්ථාව භාවිතා කරමු.

හතරවන ජාත්‍යන්තරය විසින් විස්තර කරන ලද එක්සත් පෙරමුණු (united front) ක්‍රමය මෙයයි — එනම් පන්ති සහයෝගිතාවේ මහජන පෙරමුණ (Popular Front) නොව, දේශපාලන හෙළිදරව් කිරීමේ එක්සත් පෙරමුණයි. ට්‍රොට්ස්කි, 1933 දී ලියූ "ආරක්ෂාව සඳහා වූ එක්සත් පෙරමුණ" ("The United Front for Defense") ලිපියෙන් තර්ක කළේ, කොමියුනිස්ට්වාදීන්ට සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ට ෆැසිස්ට්වාදයට එරෙහිව පොදු ක්‍රියාමාර්ග ගත හැකි බවයි — නමුත් එය කළ යුත්තේ සම්පූර්ණ සංවිධානාත්මක සහ දේශපාලනික ස්වාධීනත්වය මත පදනම්ව පමණක් වන අතර, ප්‍රතිසංස්කරණවාදී නායකයන්ගේ සටන් කිරීමට ඇති අකමැත්ත හෙළිදරව් කිරීමේ සහ ඔවුන්ගේ පාක්ෂිකයන් විප්ලවවාදී පක්ෂය වෙත දිනා ගැනීමේ අරමුණෙන්ම පමණි. එම මූලධර්මයම මෙහිදී ද අදාළ වේ: අප ලක්තිලක සහ ඩයස් සමඟ එකම වේදිකාවක් බෙදා ගන්නේ අප අතර ඇති රේඛා බොඳ කිරීමට නොව, ඒවා බිඳ වැටෙන තරමටම තියුණු කිරීමටය.

**දේශපාලන චරිතාපදාන: අප අභියෝග කරන්නේ කාටද?**

අපගේ මැදිහත්වීම අවශ්‍ය වන්නේ මන්දැයි වටහා ගැනීමට නම්, අප මෙම වේදිකාවේදී අභියෝග කරන්නේ කාටදැයි පැහැදිලිවම තේරුම් ගත යුතුය.

**නිදහස් මාධ්‍ය ව්‍යාපාරය**

FMM ආරම්භ වූයේ 1990 ගණන්වල මුල් භාගයේදී ලිබරල් සිවිල් සමාජ සහ මාධ්‍ය සඳහා පෙනී සිටීමේ සංවිධානයක් ලෙසය. රාජ්‍ය ප්‍රචණ්ඩත්වයට සහ වාරණයට එරෙහිව මාධ්‍ය නිදහසේ ආරක්ෂකයෙකු ලෙස ඓතිහාසිකව පෙනී සිටියද, එහි දේශපාලන පදනම සෑම විටම ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ සහ සිවිල් සමාජ ප්‍රතිසංස්කරණවාදයේ සීමාවන්ට කොටු වී තිබුණි. FMM බටහිර ලිබරල් පදනම්වලින් අරමුදල් සහ දෘෂ්ටිවාදීමය මගපෙන්වීම් ලබා ගනිමින්, ප්‍රධාන වශයෙන් රාජ්‍ය නොවන සංවිධාන (NGO) රාමුවක් තුළ ක්‍රියාත්මක වේ. **මාධ්‍ය කම්කරුවන්ගේ සහ පුළුල් කම්කරු පන්තියේ ස්වාධීන පන්ති බලය බලමුලු ගන්වනවා**

**වෙනුවට,** එහි මූලෝපාය රැඳී තිබෙන්නේ ධනපති රාජ්‍යයට බලපෑම් කිරීම (lobbying), ධනපති අධිකරණවලට පෙත්සම් ඉදිරිපත් කිරීම, මාධ්‍ය නිවේදන නිකුත් කිරීම සහ "ප්‍රජාතන්ත්‍රවාදී සම්මතයන්" හා ජාත්‍යන්තර මානව හිමිකම් ආයතන වලට ආයාචනා කිරීම මතය.

ධනපති ක්‍රමයේ පද්ධතිමය අර්බුදයට මුහුණ දෙන විට, FMM උත්සාහ කරන්නේ **පවතින රාජ්‍ය ව්‍යුහය තුළ සුළු ක්‍රියාපටිපාටික ආරක්ෂණයන් සඳහා ගනුදෙනු කිරීමටය.** සමාජ කප්පාදු සඳහා ධනපති රාජ්‍යයේ තල්ලුව — එනම් ජාතික ජන බලවේගය/ජේවීපී ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කරන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) වැඩසටහන — සහ නිදහස් අදහස් ප්‍රකාශනය මර්දනය කිරීමේ එහි අවශ්‍යතාවය අතර ඇති සහජ සබඳතාව හෙළිදරව් කිරීමෙන් එය වැළකී සිටියි. එහි සංවාදය, පිටතින් කතිකාවක් සඳහා වූ වේදිකාවක් ලෙස පෙනුනද, මෙම ලිබරල්-ප්‍රතිසංස්කරණවාදී රාමුව තුළ සකස් කර ඇත්තකි: **එනම්, ප්‍රශ්නය තිබෙන්නේ පෙරළා දැමිය යුතු ධනපති රාජ්‍යයක් තුළ නොව, බලපෑම් කිරීම් තුළින් සංශෝධනය කිරීමට හෝ පරාජය කිරීමට හැකි නරක පනත් කෙටුම්පතක් තුළ යැයි යන උපකල්පනය යි.**

**ශිරාල් ලක්තිලක**

ශිරාල් ලක්තිලක යනු ශ්‍රී ලංකාවේ දක්ෂිණාංශික ධනපති පන්ති දේශපාලන සංස්ථාපිතය නියෝජනය කරන ප්‍රවීණ දේශපාලන මූලෝපායඥයෙකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිඥයෙකු සහ විචාරකයෙකි. දශක ගණනාවක් තිස්සේ බල කොරිඩෝරයන් තුළ ක්‍රියාත්මක වී ඇති ලක්තිලක, එක්සත් ජාතික පක්ෂය සහ සමගි ජන බලවේගය ඇතුළු ප්‍රධාන ධනපති පක්ෂ සමඟ සමීපව කටයුතු කර ඇත. එක්සත් ජනතා නිදහස් සන්ධාන – එක්සත් ජාතික පක්ෂ (UPFA-UNP) හවුල් ආණ්ඩුව සමයේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ ජ්‍යෙෂ්ඨ උපදේශකයෙකු ලෙස කටයුතු කළ ඔහු, රාජ්‍ය ප්‍රතිපත්ති සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය මෑනවීම් මෙහෙයවීමට උපකාර කළේය.

ලක්තිලකගේ දේශපාලන කාර්යභාරය වන්නේ ධනපති රාජ්‍යයේ පන්ති සවිඥානික ආරක්ෂකයෙකු වීමයි. CIMP පනත් කෙටුම්පත ඇතුළු ආණ්ඩුවල නිශ්චිත පනත් කෙටුම්පත් වලට ඔහු දක්වන විරෝධය හුදෙක්ම උපායමාර්ගික සහ නීති පද්ධතිමය එකකි. ඔහු මාධ්‍ය නිදහස දකින්නේ කම්කරු පන්තියේ කොන්දේසි විරහිත ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් ලෙස නොව, ප්‍රභූ දේශපාලන තරඟකාරිත්වය සහ ධනපති පාලනය සඳහා අවශ්‍ය ආයතනික යාන්ත්‍රණයක් ලෙසය. ඔහුගේ දේශපාලනයේ අරමුණ ධනපති ක්‍රමයේ ස්ථාවරත්වය රැකගැනීම සහ සංගත මාධ්‍ය (corporate media) වුවමනාවන් ආරක්ෂා කිරීමයි. ඔහුගේම පක්ෂ බලයේ සිටි කාලයේ, ඔවුහු කම්කරුවන්ට සහ මාධ්‍යවේදීන්ට එරෙහිව පුවත්පත් මණ්ඩල පනත (Press Council Act), පාර්ලිමේන්තු වරප්‍රසාද නීති, පොලිස් ප්‍රචණ්ඩත්වය සහ හදිසි නීති රෙගුලාසි ආදිය මගින් තම මර්දනයේ අවි ගබඩාව ශක්තිමත් කර ගත්හ. ජාතික ජන බලවේග පාලනය පිළිබඳ ඔහුගේ විවේචනය, මූලධර්මයක් ලෙස රාජ්‍ය මර්දනයට එරෙහි විවේචනයක් නොවේ — එය පාලක පන්තියේ එක් කල්ලියක් තවත් කල්ලියකට එරෙහිව දක්වන මැසිවිල්ලකි.

**ලක්ෂාන් ඩයස්**

ලක්ෂාන් ඩයස් යනු ප්‍රකට මානව හිමිකම් නීතිඥයෙකු, සිවිල් සමාජ ක්‍රියාකාරිකයෙකු සහ ලිබරල් විචාරකයෙකි. රාජ්‍ය මර්දනයට ලක්වූවන්, ආගමික සුළුතරයන් සහ දේශපාලන විරුද්ධවාදීන් වෙනුවෙන් අධිකරණ හමුවේ පෙනී සිටිමින් ඔහු වෘත්තීය ජීවිතයක් ගොඩනගා ගෙන ඇති අතර, සිවිල් සමාජ කවයන් තුළ කැපී පෙනෙන නීතිමය හඬක් බවට පත්ව සිටී.

රාජ්‍ය මර්දනයට එරෙහි වුවද, ඩයස් ක්‍රියාත්මක වන්නේ ලිබරල්-ක්‍රියාපටිපාටික (liberal-procedural) රාමුවක් තුළය. ඔහුගේ ඉදිරිදර්ශනය උපකල්පනය කරන්නේ මහජන යහපත උදෙසා කෙරෙන නඩු පැවරීම් (public interest litigation), ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය තර්ක කිරීම් සහ ජාත්‍යන්තර බලපෑම් හරහා මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට තරම් ධනපති රාජ්‍යය සහ එහි නීතිමය යාන්ත්‍රණය ප්‍රතිසංස්කරණය කළ හැකි බවයි. ඔහු ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සලකන්නේ පන්ති සබඳතාවලින් සහ සමාජ-ආර්ථික අර්බුදයෙන් වෙන් වූ වියුක්ත නීතිමය සංකල්ප ලෙසය. **නීතිමය යාන්ත්‍රණය යනු පන්ති පාලනයේ මෙවලමක් බව නොසලකා හරින ඩයස්ගේ රාමුව, අවසානයේදී කම්කරුවන් සහ තරුණයන් යොමු කරන්නේ ධනපති කප්පාදුව ක්‍රියාත්මක කරන අධිකරණ පද්ධතිය සහ රාජ්‍ය ව්‍යුහය තුළින්ම සහන ලබා ගැනීමට උත්සාහ කිරීමටය. ඔහුගේ දේශපාලනය යනු අයදින්නෙකුගේ දේශපාලනයයි — එනම් රාජ්‍යය ස්වයං-පාලනය කර ගැනීමට පෙළඹවිය හැකිය යන විශ්වාසයයි — එය කම්කරු පන්තියට දේශපාලනිකව මාරාන්තික වේ.**

**CIMP පනත් කෙටුම්පත: රාජ්‍ය වාරණයේ ආයුධයක්**

මෑතදී අප නිකුත් කළ ප්‍රකාශනය වන 'දිසානායක ආණ්ඩුවේ "වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය": මාධ්‍ය නිදහසේ ගෙල සිර කිරීමේ සැලසුමක්' යන්නෙන් විශ්ලේෂණය කළ පරිදි, 2026 ජූනි 5 වන දින ගැසට් කරන ලද CIMP පනත් කෙටුම්පත යනු "මාධ්‍ය ප්‍රමිතීන් ඉහළ නැංවීමේ" පියවරක් නොවේ. එය රාජ්‍ය වාරණය සඳහා වූ සැලැස්මකි.

රාජ්‍යයේ පාලනයට යටත් ප්‍රතීතන (accreditation) ක්‍රමයක්, ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සෘජුවම පත් කරනු ලබන දේශපාලන "අන්තර්වාර මණ්ඩලයක්" (Interim Council) සහ අපහැදිලි ලෙස අර්ථ නිරූපණය කර ඇති "වෘත්තීය අක්‍රමිකතා" (professional misconduct) යටතේ සාමාජිකයින් ලියාපදිංචියෙන් ඉවත් කිරීමට බලය පවරා ඇති විනය කමිටුවක් නිර්මාණය කිරීම හරහා,

රාජ්‍යය විසින් මහජන කතිකාව පාලනය කරන ප්‍රධාන දොරටුපාලකයෙකු පිහිටුවමින් සිටියි. 27 වැනි වගන්තිය යටතේ එන "මාධ්‍ය වෘත්තිකයා" (media professional) යන්නෙහි අර්ථ නිරූපණය — "ලේඛකයින්, අන්තර්ගත නිර්මාණකරුවන් (content developers), අන්තර්ගත සංස්කාරකයින්, නිවේදකයින්, ඉදිරිපත් කරන්නන්, විකාශකයින්, මාධ්‍යවේදීන්, සංස්කාරකයින්, ප්‍රකාශකයින්, මාධ්‍ය හිමිකරුවන්, මාධ්‍ය කළමනාකරුවන්, මාධ්‍ය අධ්‍යාපනඥයින්, මාධ්‍ය පර්යේෂකයින්, මාධ්‍ය තාක්ෂණික ශිල්පීන් සහ කැමරා ශිල්පීන්" දක්වා — හිතාමතාම පුළුල් කර ඇත්තේ බ්ලොග්කරුවන්, සමාජ මාධ්‍ය විශ්ලේෂකයින්, යූටියුබ්කරුවන් සහ සමාජවාදී ප්‍රකාශන රාජ්‍ය විනය දැලට හසුකර ගැනීම සඳහා ය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) කප්පාදු, පෞද්ගලීකරණය සහ — හය වතාවක් දීර්ඝ කරන ලද හදිසි නීතිය සහ රජයේ මුද්‍රණාලයේ හා මාධ්‍ය කම්කරුවන්ට පනවා ඇති අත්‍යවශ්‍ය සේවා තහනම ඇතුළු — පොලිස්-රාජ්‍ය මර්දනකාරී පියවරයන්ට එරෙහිව ජනතාව අතර වැඩෙන මහජන කෝපයට මුහුණ දී සිටින ජාතික ජන බලවේගය/ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුව, පාලනයකින් තොරව පවතින ඩිජිටල් මාධ්‍ය අවකාශය තමන්ගේ පාලනයට එල්ල වී ඇති මාරාන්තික තර්ජනයක් ලෙස දකියි.

### "විරෝධතාවයේ" උගුල්

ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසේ අර්බුදය තවත් සංකීර්ණ වන්නේ පනත් කෙටුම්පතට එරෙහිව කතා කරන බව කියන හෝ එය ප්‍රසිද්ධියේ සාදරයෙන් පිළිගන්නා අයගේ දේශපාලන බංකොලොත්භාවය හේතුවෙනි.

අපගේ "පන්හිද පාවාදීම" ("The Betrayal of the Pen") ලිපියෙන් හෙළිදරව් කළ පරිදි, ආයතනගත වූ සංගත (corporate) මාධ්‍යවේදීන්ගේ වරප්‍රසාද ලත් සුළු-ධනපති ස්තරයක් CIMP පනත් කෙටුම්පත උද්යෝගයෙන් පිළිගෙන ඇත. පුද්ගලික අභිවෘද්ධිය — රාජ්‍ය සහතික ලත් තත්ත්වය, බැංකුණය, විශ්‍රාම වැටුප් සහ විදේශ වීසා — අපේක්ෂා කරන මෙම ධනපති රාජ්‍යයේ නිවටයන්, භෞතික වරප්‍රසාද වෙනුවෙන් මාධ්‍ය නිදහස පාවාදීමට සූදානම්ය. රාජ්‍යය විසින් ස්වාධීන අන්තර්ගත නිර්මාණකරුවන් සහ කම්කරු පන්තික විචාරකයන් මර්දනය කරන අතරතුර, ඔවුන් CIMP දකින්නේ කූඩුවක් ලෙස නොව, තමන්ගේ වෘත්තීය තත්ත්වය ආරක්ෂා කරන සුවිශේෂී වරප්‍රසාදිත "ක්ලබ්" එකක් ලෙසය.

අනෙක් අතට, FMM, ලක්ෂාන් ඩයස් සහ ගිරාල් ලක්තිලක විසින් ගොඩනගන "විරෝධතාවය" කම්කරු පන්තියට කිසිදු ඉදිරි මගක් පෙන්වන්නේ නැත.

**ලිබරල්/රාජ්‍ය නොවන සංවිධාන (NGO) උගුල**: FMM සහ ඩයස් වැනි ලිබරල් නීතිඥයන් රාජ්‍ය මර්දනයට එරෙහි අරගලය හුදෙක් ධනපති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදයේ රාමුව තුළ ඉල්ලීම් කිරීම්, අධිකරණ පෙත්සම් සහ බලපෑම් කිරීම් (lobbying) බවට ලඝු කරති. ඔවුහු මාධ්‍ය නිදහස ධනපති අර්බුදයෙන් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) වැඩසටහනෙන් වෙන් වූ වියුක්ත නීතිමය ප්‍රශ්නයක් ලෙස සලකති. ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ධනපති රාජ්‍යය — හෝ එහි අධිකරණය — පෙළඹවිය හැකිය යන භයානක මිථ්‍යාව ඔවුහු වර්ධනය කරති. මෙය දේශපාලන අවෘත අන්තයකි. **මර්දනකාරී යන්ත්‍රණය ගොඩනගන රාජ්‍යයට, හොඳින් තර්ක කළ නීතිමය කරුණු දැක්වීමකින් එය අහෝසි කිරීම සඳහා පෙළඹවිය නොහැක. ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් යනු විනිශ්චයකරුවන්ගේ කරුණාවෙන් ලැබෙන දේවල් නොවේ; ඒවා කම්කරු පන්තියේ සංවිධානාත්මක බලය තුළින් දිනාගත යුතු සහ ආරක්ෂා කරගත යුතු දේවල් වේ.**

**ධනපති පන්ති ආයතනික උගුල**: ලක්තිලක වැනි චරිත නියෝජනය කරන්නේ ජාතික ජන බලවේග (NPP) පාලනය පිළිබඳ හුදෙක් උපායමාර්ගික (tactical) වූ විවේචන ඉදිරිපත් කරන ධනපති විපක්ෂයේ (UNP/SJB) කල්ලිය. ඔවුහු මූලධාර්මිකව රාජ්‍ය මර්දනයට එරෙහි නොවෙති. මින් පෙර සඳහන් කළ පරිදි, බලයේ සිටියදී, ඔවුන්ගේ පක්ෂ කම්කරුවන්ට සහ මාධ්‍යවේදීන්ට එරෙහිව පුවත්පත් මණ්ඩල පනත, පොලිස් ප්‍රචණ්ඩත්වය සහ හදිසි නීති රෙගුලාසි යොදා ගත්හ. ඔවුන්ගේ අරමුණ ජනතා අත්‍යෘප්තිය ග්‍රහණය කර ගනිමින් නැවත බලයට පැමිණීමයි — එහිදී ඔවුහු එම ධනපති කප්පාදුවම සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට එරෙහි එම ප්‍රහාරයන්ම ක්‍රියාත්මක කරති. **ධනපති පන්තියේ කිනම් කල්ලියක් රාජ්‍යය පාලනය කරන්නේද යන්න පිළිබඳව කම්කරු පන්තියට කිසිදු පරදුවක් නැත. එහි කාර්යය වන්නේ එම රාජ්‍යය සම්පූර්ණයෙන්ම පෙරළා දැමීමයි.**

### අපගේ මූලෝපාය: කම්කරු පන්තියේ ස්වාධීන බලමුලු ගැන්වීම

අප මෙම සංවාදයට මැදිහත් වන්නේ FMM, ලක්තිලක සහ ඩයස්ගේ දේශපාලනයෙන් පැහැදිලිවම වෙන්වීමටත්, මාධ්‍යවේදීන්, තරුණයන් සහ කම්කරුවන්ට ට්‍රොට්ස්කිවාදී ධාරාවේ බෙදුම්කඩනය ඉදිරිපත් කිරීමටත් ය.

**මාධ්‍ය නිදහස යනු කොන්දේසි විරහිත අයිතියකි, රාජ්‍ය බලපත්‍රයක් නොවේ. මාධ්‍ය කම්කරුවන් හෝ අන්තර්ගත නිර්මාණකරුවන් සහතිකගත කිරීමට, ලියාපදිංචි කිරීමට හෝ විනයගත කිරීමට ධනපති රාජ්‍යයට කිසිදු අයිතියක් ඇතැයි යන පූර්වනිගමනය අප ප්‍රතික්ෂේප කරමු.** CIMP පනත් කෙටුම්පත සම්පූර්ණයෙන්ම පරාජය කළ යුතුය — එය සංශෝධනය කිරීම, සමනය කිරීම, ලිබරල් නීතිඥයන් සාකච්ඡා කර ලබා ගන්නා හෝ ධනපති අධිකරණ විසින් නිර්දේශ කරන "ආරක්ෂණයන්ට" යටත් නොකළ යුතුය. ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් දිනා ගන්නේ සහ ආරක්ෂා කර ගන්නේ පන්ති අරගලය මගිනි, අමාත්‍ය නියෝග හෝ අධිකරණ පුනරීක්ෂණවලින් (judicial review) නොවේ.

**කප්පාදුවට මර්දනය අවශ්‍ය වේ.** මාධ්‍ය නිදහසට එල්ල වන ප්‍රහාරය ගෝලීය ධනවාදයේ අර්බුදයට සෘජුවම සම්බන්ධ වේ. කම්කරු පන්ති

විරෝධතාව සංවිධානය වන නාලිකා මර්දනය නොකර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) නියෝග කරන ජීවන තත්ත්වයන්, සෞඛ්‍යය සහ අධ්‍යාපනය විනාශ කිරීම ක්‍රියාත්මක කිරීමට ජාතික ජන බලවේග ආණ්ඩුවට නොහැක. CIMP පනත් කෙටුම්පතට එරෙහි සටන, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනට එරෙහි, හදිසි නීතියට එරෙහි, අත්‍යවශ්‍ය සේවා නියෝගවලට එරෙහි සහ ධනපති රාජ්‍යයේ මුළු මර්දනකාරී යන්ත්‍රණයටම එරෙහි සටනෙන් වෙන් කළ නොහැක.

**ධනපති රාජ්‍යයෙන් සහ එහි නිවට සේවකයන්ගෙන් වෙන් වන්න.** විශ්‍රාම වැටුප් සහ ණය නැමැති රාජ්‍ය අල්ලස් ප්‍රතික්ෂේප කරන ලෙසත්, පාලන තන්ත්‍රය සමඟ සහයෝගයෙන් කටයුතු කරන ආයතනගත වූ මාධ්‍ය ප්‍රභූන්ගෙන් බිඳෙන ලෙසත් අප අවංක මාධ්‍යවේදීන්ගෙන් සහ අන්තර්ගත නිර්මාණකරුවන්ගෙන් ඉල්ලා සිටිමු. ධනපති රාජ්‍යයට සේවය කරන පෑන අවසානයේදී එම රාජ්‍යය විසින්ම සුනුවිසුනු කර දමනු ඇත. **ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කප්පාදුවලට, අධිරාජ්‍යවාදී යුද්ධයට සහ ධනපති ආඥාදායකත්වයට එරෙහිව කම්කරු පන්තියේ අරගල සමඟ පෙළගැසෙන පෑන නොසැලෙන ආරක්ෂාවක් සොයා ගනු ඇත.**

**මාධ්‍ය කම්කරුවන්ගේ ක්‍රියාකාරී කමිටු (rank-and-file/action committees) ගොඩනඟන්න.** අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, ධනපති අධිකරණවලට හෝ පාර්ලිමේන්තු කමිටුවලට කරන ඉල්ලීම්වලින් ආරක්ෂා කළ නොහැක. ඊට කම්කරු පන්තියේ ස්වාධීන බලමුලු ගැන්වීම අවශ්‍ය වේ. මාධ්‍ය කම්කරුවන්, තාක්ෂණික කම්කරුවන් සහ අන්තර්ගත නිර්මාණකරුවන්, සංගත මාධ්‍ය හිමිකරුවන්ගෙන්, වෘත්තීය සමිති නිලධාරී තන්ත්‍රයෙන් සහ රාජ්‍ය යන්ත්‍රණයෙන් සම්පූර්ණයෙන්ම වෙන් වූ ස්වාධීන ක්‍රියාකාරී කමිටු පිහිටුවා ගත යුතුය. මෙම කමිටු තමන්ගේ අරගලය — රෝහල්වල, විදුලිබල මධ්‍යස්ථානවල, තැපැල් කාර්යාලවල, පාසල්වල සහ වතුකරයේ — පොදු සතුරාට එරෙහි කම්කරු පන්තියේ පුළුල් සටන සමඟ **සම්බන්ධ** කළ යුතුය.

**ධනපති පක්ෂ සහ ඒවායේ වෘත්තීය සමිති අංකුර මත නොව, ක්‍රියාකාරී කමිටු මත පදනම් වූ කම්කරු ආණ්ඩුවක් සඳහා සටන් වදින්න.** මාධ්‍ය නිදහසේ අවසාන හා පූර්ණ සහතිකය වන්නේ ධනපති රාජ්‍යය පෙරළා දැමීම සහ ප්‍රජාතන්ත්‍රවාදීව තෝරා පත් කර ගන්නා ලද ක්‍රියාකාරී කමිටු මත පදනම් වූ කම්කරුවන්ගේ හා ගොවියන්ගේ ආණ්ඩුවක් පිහිටුවීමයි. එමගින් බැංකු, ප්‍රධාන සමාගම් සහ මාධ්‍ය කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතට පත් කරනු ඇත.

**සමාජය සමාජවාදී ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා ඉදිරියට —** සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයේ සහ මාධ්‍ය නිදහසේ එකම පදනම එයයි.

### දේශපාලන යුද්ධයක් සඳහා වූ වේදිකාවක්

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ මෙම වේදිකාව අප භාවිතා කරන්නේ ලක්තිලක සහ ඩයස් සමඟ සම්මුතියක් ඇති කර ගැනීමට නොව, ඔවුන් නියෝජනය කරන සියල්ලටම එරෙහිව දේශපාලන යුද්ධයක් දියත් කිරීමටය. අප ඔවුන්ගේ සගයන් නොවේ. කිසිදු අර්ථවත් ආකාරයකින් අප ඔවුන්ගේ සහ-කථිකයන් නොවේ. අප ඔවුන්ගේ සමගි කළ නොහැකි දේශපාලන පසමිතුරන් වන අතර, ලිබරල් ප්‍රතිසංස්කරණවාදයේ සහ ධනපති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදයේ දේශපාලනය උගුලක් වන්නේ ඇයිද යන්නත්, ධනපති රාජ්‍යය ප්‍රතිසංස්කරණය කළ නොහැක්කේ ඇයිද යන්නත්, මාධ්‍ය නිදහස ආරක්ෂා කළ හැකි එකම බලවේගය ස්වාධීනව සංවිධානය වූ සහ සමාජවාදී වැඩසටහනකින් සන්නද්ධ වූ ජාත්‍යන්තරව එක්සත් වූ කම්කරු පන්තිය පමණක් වන්නේ ඇයිද යන්නත් මෙයට සහභාගී වන මාධ්‍යවේදීන්ට, මාධ්‍ය කම්කරුවන්ට සහ තරුණයන්ට පෙන්වා දීමට අප මෙම සම්මේලනයේ සෑම මිනිත්තුවක්ම භාවිතා කරන්නෙමු.

**කම්කරු පන්තිය තමන්ගේ සතුරාගෙන් අයැද සිටින්නේ නැත.** එය සතුරා පරාජය කිරීමට බලමුලු ගැසෙයි. සැබෑ ප්‍රකාශනයේ නිදහස ආරක්ෂා කිරීමේ එකම තථ්‍ය සහතිකය වන සමාජවාදය සඳහා වූ ස්වාධීන ව්‍යාපාරය ගොඩනැගීමට අප හා එක්වන ලෙස අප මාධ්‍ය කම්කරුවන්ගෙන්, තරුණයන්ගෙන් සහ කම්කරු පන්තියෙන් ඉල්ලා සිටිමු.

---

## SLLA Political Graphics









Socialism AI
by the WSWS
Ask a question
SocialismAI.com

මාක්ස්වාදය, භූ දේශපාලනය හා ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරය පිළිබඳ ප්‍රශ්න ලෝක සමාජවාදී වෙබ් අඩවිය විසින් නිර්මිත ආවර්ධිත බුද්ධියේ නව යෙදුම
Socialism AI වෙතින් අසන්න. SocialismAI.com වෙත පිවිසෙන්න.

**Socialism AI ඔබගේ දෛනික දේශපාලන අධ්‍යාපනයේ හා ක්‍රියාකාරකම්වල කොටසක් කර ගැනීමට අපි අපගේ සියලුම පාඨකයින්ට ආරාධනා කරමු.**

**සියල්ල රඳා පවතින්නේ අප කරන දේ මත ය. සමාජවාදය සඳහා සටනට සංවිධානය සහ දේශපාලන ඉදිරිදර්ශනය අවශ්‍ය වේ. කිසිවක් ස්වයංක්‍රීයව සිදු නොවේ. ධනවාදය නැවත වරක් මානව වර්ගයා ප්‍රශ්න පිළිබඳ ප්‍රශ්නයට යොමු කරයි: එනම් සමාජවාදය ද, ම්ලේච්ඡත්වය ද යන ප්‍රශ්නයයි.**

**අප ජීවත් වන්නේ පන්ති සමාජයක ය. එහි කම්කරු පන්තියේ පැත්ත ගන්න. ලෝකය යහපත් ලොවක් බවට පරිවර්තනය කළ හැක්කේ කම්කරු පන්තියේ නායකත්වය යටතේ එම පන්තිය ද, සෙසු පීඩිත ජනතාව ද එක්සත් කිරීමෙන් පමණි. ඒ සඳහා එහි ලෝක පක්ෂය වන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව හා එහි ශාඛා ගොඩනගන්න. ලෝක සමාජවාදී වෙබ් අඩවිය ගොඩ නැගීමේ අරමුදලට සහාය දෙන්න. ලෝක සමාජවාදී විප්ලවයේ ඉදිරිදර්ශනය සහ වැඩසටහනෙන් කම්කරු පන්තිය සන්නද්ධ කිරීමේ සටනට සහාය දෙන්න. ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA) සමග එක් වන්න.**

**The Socialist** සඟරාව ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප/SEP) විප්ලවවාදී වාම කන්ඩායම වන **ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය** (SLLA) හි ඩිජිටල් මාසික ප්‍රකාශනයයි. එහි සියලු කලාප download කර ගැනීමට මෙහි පිවිසෙන්න: https://www.thesocialist.lk/monthly-magazine/. මෙහි පළකරනු ලබන සියලු ලිපි පිළිබඳ ඔබගේ අදහස් හා සාකච්ඡා සඳහා අපව සම්බන්ධ කර ගැනීමට අපට ලියන්න: socialistlead@gmail.com. අපගේ වෙබ් අඩවිය **theSocialist.lk** නිති පතා කියවන්න. **The Socialist World** YouTube නාලිකාවේ විවරණ අසන්න. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (ICFI) ලෝක ප්‍රකාශනය වන ලෝක සමාජවාදී වෙබ් අඩවිය wsws.org දිනපතා කියවන්න. සසප යනු ICFI හි ලංකා ශාඛාවයි. එසේම කම්කරු පන්තියේ නායකත්වය ගොඩනැගීමේ අපගේ අරගලයට එකතු වන්න. **theSocialist.lk** සඳහා මුදලින් දායක වන්න.

**ලංකාවේ එකම සමාජවාදී සඟරාව, The Socialist ඩිජිටල් කලාප ඔබගේ හිතවතුන් අතර බෙදා හරින්න.** සඟරාව WhatsApp හරහා ලබා ගැනීමට 0777497101 වෙතින් ඉල්ලුම් කරන්න.

World Socialist Web Site WSWS.ORG

සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ලිපි දිනපතා කියවන්න